Vidyodaya Journal of Humanities and Social Sciences

VJHSS (2024), Vol. 09 (01)

# A Study of the Philosophical Significance of the Teachings in the *Kaṭhopaniṣad*

R. P. C. H. Perera
Department of Philosophy, Faculty of Arts, University of Peradeniya, Sri Lanka

**Article Info**
Article History:
Received 22 Aug 2023
Accepted 16 May 2024
Issue Published Online
01 January 2024

**Key Words:**
Kaṭhopaniṣad
Upaniṣad Literature
Metaphysics
Epistemology
Philosophy

*Corresponding author
E-mail address:
chammm2233@gmail.com

https://orcid.org/0000-0001-7713-3707

Journal homepage:
http://journals.sjp.ac.lk/index.php/vjhss

http://doi.org/10.31357/fhss/vjhss.v09i01.15

VJHSS (2024), Vol. 09 (01), pp. 224-237

ISSN 1391-1937/ISSN 2651-0367 (Online)

Faculty of Humanities and Social Sciences 2024

## ABSTRACT

*Upaniṣad literature can be called the most important group of Vedic literary works in Eastern philosophy, and one of its most important Upaniṣads called Kaṭhopaniṣad, is an Upaniṣad book of outstanding value literary and philosophically. This work, which belongs to the Krișna Yajurveda, discusses the facts in the form of a dialogue between Nachiketas and Yama. The primary purpose of this research is to investigate to what extent the philosophical importance of the teachings in the Kaṭhopaniṣad, and to what extent the teachings contained in the Kaṭhopaniṣad are similar to other Indian philosophical teachings and whether it covers all the basic study areas of the philosophy. It is expected to conduct a comprehensive study in this work. As this research is mainly used the book research method, it is primarily based on the study of primary and secondary sources. In addition to this, interviews with experts, journal articles and internet sources are used to gather information. Several philosophical methodologies are used to analyze the research problems including descriptive analysis, critical method, comparative method and analytical method. According to the analysis of this research, the final conclusion can be implied that there can be many similarities between Kaṭhopaniṣad and Buddhism not only in terms of the ideas of the teachings of it but also in the way of expression in its technical terms. In addition to this, another point in the conclusion is that philosophically Kaṭhopaniṣad is an extremely important literary work that includes a certain kind of metaphysics, cosmology, epistemology, psychology as well as ethics.*

**මාතෘකාව**

කඨෝපනිෂදයෙහි අන්තර්ගත ඉගැන්වීම්වල දාර්ශනික වැදගත්කම පිළිබඳ අධ්‍යයනයක්

## 1. හැඳින්වීම

දර්ශන විෂයට නිශ්චිත ආරම්භයක් දැක්වීමට ඉතා අසීරුය. ඊට හේතුව මිනිසා නිශ්චිතවම තමා සහ ලෝකය ගැන ගැඹුරින් තාර්කිකව විමසා බැලීමට පටන් ගත් දිනය අපැහැදිලි වන නිසාය. එබැවින් මිනිසා සිතන්නට පටන් ගත් දා සිටම දර්ශන විෂයෙහි උපතද සිදු වුවා යැයි සිතිය හැකිය. ඒ කෙසේ වෙතත් අනෙකුත් සෑම විෂයකටම මෙන් සම්මුති ලෝකය තුළ දර්ශන විෂයේ උපතත් පිළිගැනේ. දර්ශනය ප්‍රධාන වශයෙන් බටහිර දර්ශනය සහ අපරදිග දර්ශනය යනුවෙන් කොටස් දෙකකට වර්ග කෙරේ. මේ අතරින් බටහිර දර්ශනය යැයි කියනු ලබන්නේ ග්‍රීසිය, රෝමය, ප්‍රංශය, ජර්මනිය, එංගලන්තය වැනි බටහිර රටවල්වල චින්තකයන් විසින් මිනිස් ශිෂ්ටාචාරයට දායාද කළ දාර්ශනික සිතුවිලිවලින් ඔපවත් වන චින්තන පද්ධතියකි. අනෙක් අතට පෙරදිග දර්ශනය යැයි කියනු ලබන්නේ භාරතය, චීනය, ජපානය වැනි පෙරදිග රටවල්වල බිහිවන්නා වූ දාර්ශනිකයන්ගේ දාර්ශනික සිතුවිලිවලටය.

පෙරදිග දර්ශනයේ ඉතිහාසය නිශ්චිතවම නිගමනය කිරීම දුෂ්කර කාර්යයකි. කෙසේ වෙතත් පෙරදිග දර්ශනයේ උපත ක්‍රි. පූ. 3000ත් 2000ත් අතර කාලය තුළ සිදු වුවා යැයි අනුමාන කළ හැකි සාක්ෂි ඇත. භාරතයට තවත් පැහැදිලිව අනාවරණය නොවූ ප්‍රාග් ඉතිහාසයක් ද ඇත. එනම් ඉන්දු නිම්න ශිෂ්ටාචාරයයි. ඉන්දු නිම්න ශිෂ්ටාචාරය ක්‍රි. පූ. 5000ත් තරම් ඈත යුගයකට සම්බන්ධ වේ. බැබිලෝනියානු ශිෂ්ටාචාරය, ඊජිප්තු ශිෂ්ටාචාරය වැනි පූරාණ ශිෂ්ටාචාර ඉන්දු නිම්න ශිෂ්ඨාචාරයට සමකාලීන වෙයි. මොහෙන්දොජාරෝ සහ හරප්පා යන පෞරාණික නගරවලින් හමු වූ නෂ්ටාවශේෂවලින් පැහැදිලි වන්නේ එම යුගයෙහි භෞතික වශයෙන් මෙන්ම ආධ්‍යාත්මික වශයෙන්ද දියුණු වූ ශිෂ්ටාචාරයක් පැවති බවයි.
වෛදික යුගය ආරම්භ වන්නේ ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙන් පසුවය. ක්‍රි. පූ. 2000ත් 3000ත් අතර කාලයේ පර්සියාවේ සිට ඉරාකය, ඉරානය හා ඇෆ්ගනිස්තානය හරහා ඉන්දියාවේ වයඹ දිගින් සංක්‍රමණය වන විදේශීය ජන කණ්ඩායමක් සහ එවකට භාරතයේ සිටි ස්වදේශීය ජන කණ්ඩායම් එකට මිශ්‍ර වීමෙන් වෛදික සභ්‍යත්වය ගොඩනැගේ. එම සභ්‍යත්වය තුළ රචනා වන පැරණිතම සාහිත්‍යය ලෙස සලකනු ලබන්නේ වෛදික සාහිත්‍යයයි. එය ප්‍රධාන වශයෙන් කොටස් හතරකට බෙදනු ලැබේ. එනම්, වෛදික, බ්‍රාහ්මණ, ආරණ්‍යක, සහ උපනිෂද් වශයෙනි. මේවා අතුරින් වඩාත් දාර්ශනික සංකල්ප අන්තර්ගත වන්නේ වෛදික සාහිත්‍යය තුළ සහ උපනිෂද් සාහිත්‍යය තුළය. මෙයින් උපනිෂද් වූ කලි වෛදික සාහිත්‍යයේ අවසන් කොටස බැවින් එය වේදාන්ත යනුවෙන්ද නම් ලබයි.
උප+නි+√සද් ලෙසින් නෛරුක්තිකයන් දක්වනු ලබන උපනිෂද් යන්නෙහි මූලික හරය වන්නේ " සමීපයෙහි ඉඳගැනීමයි". එනම් උපනිෂද් යනු ළඟ සිට හැදෑරීම යන තේරුම ගෙන දෙන්නකි. තවත් ලෙසකට දක්වන්නේ නම් භක්තියෙන් ළඟින් වාඩි වී ගුරුවරයාගෙන් රහසින් ඉගෙන ගැනීම යන්නයි. උපාසන යන වචනය මෙන් මෙයින්ද පිදීම යන අර්ථය පැවසෙයි යන මතය වින්ටර්නිට්ස් ප්‍රතික්ෂේප කරයි (ශාන්තසිරි හිමි, 2011). මෙම උපනිෂද්වරු හඳුන්වනු ලැබූ නාමය වූයේ මුනිවර යන්නයි. උපනිෂද් ග්‍රන්ථ මූලික වශයෙන් යුග කිහිපයක් යටතේ බෙදා දැක්විය හැකිය. එනම්,

1. ප්‍රාග් බෞද්ධ යුගයට අයත් ග්‍රන්ථ
2. බුද්ධකාලීන යුගයට අයත් ග්‍රන්ථ
3. බුද්ධකාලීනයට පසුකාලයට අයත් ග්‍රන්ථ වශයෙනි.

ප්‍රධාන වශයෙන් උපනිෂද් ග්‍රන්ථ 200ක් පමණ ඇතැයි විශ්වාස කෙරෙන අතර තවමත් ඉන් සොයා ගැනීමට හැකි වී ඇත්තේ ග්‍රන්ථ 13ක් පමණි (ඤාණිස්සර හිමි, 1988). උපනිෂද් යුගයට අයත් ග්‍රන්ථ කිහිපයක් පහත පරිදි දැක්විය හැකිය.

- බෘහදාරණ්‍යක
- ඡාන්දෝග්‍ය
- තෛත්තිරීය
- ඓතරේය
- කාඨක
- ශ්වේතාශ්වර
- කේන
- කෞෂීතකී
- ඊශා
- මුණ්ඩක
- මහානාරායණ
- ප්‍රශ්න

උපනිෂද් මුනිවරුන්ගේ නිෂ්ඨාව වූයේ සත්‍ය අවබෝධය ලබා විමුක්තියට පත්ව අමෘතය හෙවත් අමරණීයත්වය සෙවීමයි. අමෘතය යනු යළි නොඉපදීම බව මෙමගින් හැඟවේ. මේ සම්බන්ධයෙන් බෘහදාරණ්‍යක උපනිෂදයේ අන්තර්ගත පාඨයක අදහස දැක්විය හැකිය.

"ඕම් ශාන්ති ශාන්ති ශාන්ති
අසත්‍යයෙන් සත්‍ය කරා මා ගෙන යේවා
අඳුරෙන් ආලෝකය කරා ගෙන යේවා
මරණයෙන් අමරණීයත්වය කරා ගෙන යේවා"
(Madhawananda, 1950, p. I, 3.28)

මෙම සෑම උපනිෂද් සාහිත්‍යය නිර්මාණයක් තුළම අන්තර්ගත වන දාර්ශනික කරුණු ඉදිරිපත් වී ඇත්තේ සංවාදමය ස්වභාවයකට අනුවය. මෙසේ ඉදිරිපත් වන උපනිෂද් නිර්මාණයන් අතුරින් කඨෝපනිෂදය සාහිත්‍යමය වශයෙන් මෙන්ම

දාර්ශනික වශයෙන්ද සුවිශේෂ3.අගයකින් සමන්විත වෙයි. කෘෂ්ණ යජුර්වේදයට අයත් වන මෙම කෘතිය නචිකේතස් හා යම අතර ඇති වූ සංවාදයක ස්වරූපයෙන් කරුණු සාකච්ඡා කරයි.

## 2. පර්යේෂණ ක්‍රමවේදය

අනුරාධ සෙනෙවිරත්න විසින් 2007 දී රචනා කරන ලද කෘතියක් වන උපනිෂද්= වේදාන්ත දර්ශනය තුළ කඨෝපනිෂදයේ සඳහන් වන ඥාන විභාගීය පදනම ඉදිරිපත් කර තිබේ. මෙහි විශේෂයෙන්ම බ්‍රහ්ම ඥානයේ ස්වරූපයත් එය ලබා ගත යුතු අයුරුත් ඒ සඳහා පිළිපැදිය යුතු මාර්ගත් අවසන් ප්‍රතිඵලය ලැබුණු පසු උදාවන තත්ත්වයත් උපමා රූපක ඔස්සේ සාකච්ඡා කොට ඇත. සුමනලාල් කැකුළාවල 1961 දී රචිත කඨෝපනිෂදය නම් ග්‍රන්ථය තුළ කඨෝපනිෂදයේ අන්තර්ගත නචිකේතස් හා යම අතර ඇති වූ සියලුම සංවාදයන් සිංහල පරිවර්තනයක් වශයෙන් ඉදිරිපත් කොට ඇත. එහි එක් එක් පාඨයන් තුළින් දර්ශන විෂය විවිධ විෂය ක්ෂේත්‍රයන් වන පාරභෞතික විද්‍යාව, ලෝක විභාගය, ආචාර ධර්ම, ඥාන විභාගය, සහ මනෝ විද්‍යාවට අදාළ දාර්ශනික කරුණු ඇතුළත් පාඨ අන්තර්ගත වෙයි. 1988 දී අල්පිටියේ ඥාණිස්සර හිමියන් විසින් රචනා කරන ලද භාරත දර්ශනය නම් කෘතිය තුළ උපනිෂද් යනු කුමක්ද යන්න සම්බන්ධයෙනුත් උපනිෂද් සාහිත්‍යය සම්බන්ධයෙනුත් සවිස්තරාත්මක පරිච්ඡේදයක් අන්තර්ගත වෙයි. නාරවිළ ධර්මකීර්ති හිමි සහ හැඩිපන්නල පඤ්ඤාලෝක හිමි විසින් 1950 දී රචිත භාරතීය දර්ශන නැමැති කෘතියෙහි උපනිෂද් දර්ශනය පිළිබඳ පරිච්ඡේදයක් අන්තර්ගත වෙයි. මෙහිදී කඨෝපනිෂදය උපුටා දක්වමින් පුද්ගල මනසේ උපයුක්තතාව පිළිබඳව අවධාරණය කරයි. මේ අනුව කඨෝපනිෂදයෙහි අන්තර්ගත මනෝවිද්‍යාත්මක කරුණු පිළිබඳව පුළුල් අවබෝධයක් ලබා ගත හැකිය. නෙළුවේ සුමනවංස හිමි විසින් 2013 රචිත කඨෝපනිෂද්, ප්‍රශ්නෝපනිෂද් හා ශ්වේතාශ්වතර උපනිෂද් නැමැති ලිපියෙහි පුද්ගලයාගේ ආත්මයේ කොටස් දෙකක් වන ජීවාත්මය සහ පරමාත්මය යන කොටස් දෙක පිළිබඳ කඨෝපනිෂදයේ අන්තර්ගත කරුණු පිළිබඳ පුළුල් විස්තරයක් අන්තර්ගත වේ.

මෙම පර්යේෂණය ප්‍රධාන වශයෙන් ප්‍රාථමික සහ ද්විතීයික මූලාශ්‍රය මත පදනම් වූ අධ්‍යයනයකි. ඒ ඒ අවස්ථාවලදී අවශ්‍ය පරිදි අදාළ කරුණුවලට උචිත ප්‍රාමාණිකයන් මගින් තොරතුරු ලබා ගැනීම, ශාස්ත්‍රීය සඟරා පරිශීලනය සහ අන්තර්ජාලය හරහා තොරතුරු ලබා ගැනීමද මෙහිදී අභිමත වෙයි. එමෙන්ම දත්ත විශ්ලේෂණයේදී විස්තරාත්මක විශ්ලේෂණය, තුලනාත්මක විශ්ලේෂණය, විශ්ලේෂී ක්‍රමය සහ විචාරාත්මක ක්‍රමවේදය යොදා ගනු ලැබේ.

## 3. ප්‍රතිඵල හා සාකච්ඡාව

### කඨෝපනිෂදය පිළිබඳ හැඳින්වීමක්

පෙරදිග දර්ශනය තුළ වෛදික සාහිත්‍ය කෘතිවල වැදගත්ම කෘති සමූහය ලෙස උපනිෂද් :ඔච්බසියා* කෘති හැඳින්වීම සාධාරණය. මන්දල ආරණ්‍යකවලින් ආරම්භ වූ ඇතැම් මූල බීජ අවස්ථාවන් මුහුකුරා යමින් දර්ශනවාද රාශියකටත් එයින් භාරතීය චින්තනයෙහි අතිදැවැන්ත චින්තන පෙරළියකටත් මූලික වූ අදහස් ගැබ්ව පැවති කෘති පෙළක් වන බැවිනි. උපනිෂද් යන්නෙහි අරුත වන්නේ ශිෂ්‍යයා තම ආචාර්යවරයා සමීපයෙහි හිඳුවා ගෙන කරනු ලබන ඉගැන්වීම යන්නයි. මේ අනුව ලැබී ඇති උපනිෂද් සංඛ්‍යාව අතිවිශාලයි.

එයින්ද උපනිෂද දහයකට ශංකරාචාරීන් විසින් අටුවාවන් ලියා සංග්‍රහකොට තිබේ. මෙසේ දීර්ඝ ඉතිහාසයක් සහිත උපනිෂද් සාහිත්‍ය අතුරින් මුඛ්‍යෝපනිෂද් ලෙස විශේෂ අවධානයට භාජන වන උපනිෂද් 12කි (කළුපහන, 1963). එම ග්‍රන්ථ අතුරින් කඨෝපනිෂදය (The Kaṭhopaniṣad) සාහිත්‍යමය වශයෙන් පමණක් නොව දාර්ශනික වශයෙන්ද සුවිශේෂ වූ අගයකින් යුත් උපනිෂද් කෘතියක් වෙයි.

කෘෂ්ණ යජුර්වේදයට අයත් වන මෙම කෘතිය නචිකේතස් හා යම අතර ඇති වූ සංවාදයක ස්වරූපයෙන් කරුණු සාකච්ඡා කෙරෙන ග්‍රන්ථයකි. එහි පද්‍ය 120ක් සහ අධ්‍යාය දෙකකින් සමන්විත කුඩා උපනිෂද් ග්‍රන්ථයක් වන අතර එහි ප්‍රථමාධ්‍යායයෙහි මෙන්ම ද්විතීයාධ්‍යායයෙහි වල්ලි තුන බැගින් අන්තර්ගත වෙයි. අධ්‍යාය යන්න පාඩම, දේශනය, පරිච්ඡේදය" (කළුපහන, 1963) යන අරුත දෙන්නකි. වල්ලි යනු "වැල" අරුත් දෙයි. අරුත් දෙයි. තවද මෙය ධාරා ෂුකෝග් කුමරුගේ මෙහෙය වීමෙන් ක්‍රි.ව. 1656=1657 දී පර්සියන් බසට පෙරළුණු උපනිෂද වලින් එකකි. එමෙන්ම රාම් මෝහන් රෝයි අතින් ඉංග්‍රීසියට පරිවර්තනය වූ මුල්ම උපනිෂදයද වෙයි. අනෙකුත් උපනිෂද් ග්‍රන්ථ අතර මෙම ග්‍රන්ථය සම්භාවනීයත්වයට පත් වීමට පහත දැක්වෙන කරුණු කිහිපය බලපා ඇත.

1. බහුතරයක් උපනිෂද්හි ඇති ආකුල ව්‍යාකුලභාවයෙන් තොර වීම
2. අනවශ්‍ය තොරතුරුවලින් විනිර්මුක්ත වීම
3. සාහිත්‍ය රසයෙන් මිශ්‍රිත වීම
4. ඍජු හා ප්‍රායෝගික විමුක්ති මාර්ගයක් දැක්වීම

කඨෝපනිෂදයට මෙවැනි තත්ත්වයක් ලැබෙන්නේ හුදෙක් එහි දැක්වෙන ඉගැන්වීම් නිසාම නොවෙයි. එය අතිශ්‍රේෂ්ඨ උපනිෂදය යැයි කිව හැකිය. එය පැරණිතම උපනිෂදයද නොවෙයි. නමුත්, උසස්ම දාර්ශනික අදහස් කාව්‍ය ස්වරූපයෙන් එහි දැක්වේ. සාංඛ්‍යල යෝගල වේදාන්ත ඉගැන්වීම් මැනවින් වෙන් නොකර පැවති අවදිය තුළ සැපයුණැයි සිතිය

හැකි කඨෝපනිෂදය භගවද්ගීතාවෙහි දැක්වෙන ඇතැම් ඉගැන්වීම්වලටද ආලෝකය ලබා දුනි (කැකුළාවල, 1961). මේ අනුව නිර්මිත වූ කඨෝපනිෂදයෙහි අන්තර්ගත ඉගැන්වීම්වල දාර්ශනික වැදගත්කමකින් යුත් කරුණු රාශියක් පවත්නා බව අප කලින් සඳහන් කළෙමු. එම කරුණු ප්‍රධාන මාතෘකා පහක් යටතේ අවධානයට ලක් කිරීමට මෙහිදී බලාපොරොත්තු වෙමු. එම තේමා පහත පරිදි දැක්විය හැකිය.

1) පාරභෞතික විද්‍යාව (Metaphysics)
2) ලෝක විභාගය (Cosmology)
3) ඥාන විභාගය (Epitemology / Theory of Knowledge)
4) මනෝ විද්‍යාව (Psychology / Philosophy of Mind)
5) ආචාර ධර්ම (Ethics)

මෙම එක් එක් තේමාවන් යටතේ අතිශය වැදගත් වන්නා වූ දාර්ශනික වැදගත්කමකින් යුත් අදහස් ඉදිරිපත් වී තිබෙන බව පෙනෙන අතර එම අදහස් පහත පරිදි සංක්ෂිප්තව දැක්විය හැකිය.

**පාරභෞතික විද්‍යාව (Metaphysics)**

පාරභෞතික යනුවෙන් අදහස් කෙරෙනුයේ ඉන්ද්‍රියයන්ට හසුකර ගත නොහැකි දේ යන්නයි. පරමාර්ථ සත්‍යය වනාහී ඉන්ද්‍රියවිෂය ඉක්මවා යන්නකි. ඒ අනුව පාරභෞතික විද්‍යා යනුවෙන් අදහස් කරන්නේ කඨෝපනිෂදය මගින් විවරණය කර ඇති පරමාර්ථ සත්‍යය පිළිබඳ ස්වරූපයයි. මෙහි පවත්නා පරමාර්ථ සත්තාව වනාහී ආත්මන් නොහොත් බ්‍රහ්මන් වේ. එය තර්කය තුළින් ලද හැක්කක් නොව ස්වකීය බුද්ධියෙන්ම වටහා ගත යුත්තකි. ධර්ම-අධර්ම දෙකින් කළ නොකළ හෙයින්ද පෙර වූ හා මතු දෙයින්ද සත්තාව වෙනස් වෙයි. මෙම තත්ත්වය ග්‍රන්ථ හැදෑරීමෙන් නුවණින් හෝ බහුශ්‍රැත බවින් වටහා ගත නොහැකි අඩ්ගුෂ්ඨමාත්‍රා පුද්ගල හෘදයාභ්‍යන්තරයෙහි ලැගුම් ගෙන සිටියි. එය දැන ගත යුතු වන්නේ ආත්ම ඥානය ලද්දකු ප්‍රකාශ කරන කලය. ඒ සඳහා වන අවශ්‍යතා කිහිපයක් තිබිය යුතුය.

1. බ්‍රහ්මන් හා ඒකීභූත වුවකු (ආත්ම ඥානය ලබා ගත් අයකු) එය ප්‍රකාශ කරන කල්හි ඒ පිළිබඳ විවිධාකාර සිතුවිලි ඇති නොවීම.
2. ආත්මඥාන ලාභියකු එය ප්‍රකාශ කරනු ලැබූ කල්හි දත යුතු අනෙකක් නැතිවීම.
3. බ්‍රහ්මාත්මභූත වුවකු එය ප්‍රකාශ කළ කල්හි ඒ පිළිබඳව අවබෝධයක් නොවීම.
4. ස්වාත්මයෙන් අන්‍ය නොවූවකු එය පැහැදිලි කරන විට සසර ගමනක් නොවීම.
5. ශරීරයක් නැසී ගියද නොනැසී පවත්නා මෙම තත්ත්වය අතිශයින්ම ගූඪ වේ (සුමනවංශ හිමි, 2002).

පාරභෞතික විද්‍යා සම්බන්ධයෙන් අවකාශය (space), කාලය (time) හා හේතුව (cause) යන කරුණු වැදගත් වේ. අවකාශය (දේශ) යනුවෙන්ද හේතුව නිමිත්ත යනුවෙන්ද පැහැදිලි කරන අතර බ්‍රහ්මන් මේ හැම එකකින්ම වෙනස් වූවකි. ආත්මන් සහ බ්‍රහ්මන් වනාහී සූක්ෂ්ම දෙයටද වඩා සූක්ෂ්මතරද මහත් දෙයට වඩා මහත්තරද වේ. එනම්ල එය සර්වව්‍යාපීයල සර්වගතල ශබ්දයෙන් තොරල රූපයෙන් තොරල ස්පර්ශයෙන් තොර තත්ත්වයක් ලෙසත් ආරම්භයක් අවසානයක් නොමැති සියල්ල ඉක්මවා පවත්නා වූ සත්තාවක් ලෙසත් බ්‍රහ්මන් විවරණය වෙයි.

භෞතික ලෝකය සම්බන්ධ කරුණු කෙරෙහි පමණක් කාලයේ සීමා බලපවත්වනු ලැබේ. පරමාර්ථ සත්තාව වූකලී එවැනි නියමයකින් සීමා කර දැක්වීමට නුපුළුවන. ඹඅන්‍යයත්‍ර භූතාච්ච භව්‍යාච්ච□ පෙර වූ සහ මතු වන දෙයින්ද එමෙන්ම අතීත අනාගත යන කාලභේදයන්ගෙන් එය තොර වන බව මෙහි පැහැදිලි කර දක්වා ඇත. එමෙන්ම නූපන් නොමැරෙන ශාස්වත වූ සදාකාලික වූ ස්වරූපයක් වන බ්‍රහ්මන් ද ඇත. නඅත යන උභය පක්ෂයෙන්ද තොර වූවකි. අප ශරීරයෙහි ශරීරය වන අනිත්‍යයෙහි නිත්‍ය වන එය මරන්නා මැරීමට සිතුවද මැරුණේ මළැයි සිතුවද ඒ එකම ස්වරූපයක් වත් නොමැත. ඉන්ද්‍රිය විෂය ඉක්මවූ අතීන්ද්‍රිය ග්‍රාහකයන් ලෙසින් එය විවරණය කර ඇත.

බ්‍රහ්මන් හෝ ආත්මන් පදාර්ථය වනාහි හේතුඵල නියමයෙන්ද අන්‍ය වූවකි. හේතු ධර්මතාව නම් ක්ෂණිකව සිදුවන විපරිණාමයයි. එහෙත් මෙය එවැනි තත්ත්වයක් පත් නොවන්නක් වන අතර බ්‍රහ්මන් වනාහී කෘතල අකෘතල භූතල භව්‍ය විශේෂණයන්ට ලක් නොවෙයි. විපශ්චිත් (ආත්මය) කිසිදිනක ඉපදෙන්නේ නැත. එමෙන්ම නොමැරෙයි. කිසිවක් ඇති වුවක්ද නොවන අතර තමාගෙන් ඇතිවන්නේද නොවේ. හේ අජයල නිත්‍යයල ශාස්වතයල පුරාණය. සිරුර නස්නා කල්හිදු එය නොනැසේ.

කඨෝපනිෂදයේ දැක්වෙන උතුම්ම වූ තත්ත්වය ආත්මන් හා බ්‍රහ්මන් යන්නෙන් විස්තර කෙරෙයි. සමස්ත උපනිෂද් ඉගැන්වීම් තුළද මෙය අක්ෂරල අන්තර්යාමින්ල එකංසත්ල කව්ල ජීවල පුරුෂල මහත්භය. විඥාතෘල විපශ්චිත්ල කූටස්ථ යන නම්වලින් විවරණය වී ඇත. බොහෝ දෙනා පිළිගත් මතයක් වනුයේ බ්‍රහ්මන් නමැති ක්‍රියා නාමය ⁝ජඑසදබ බදමබ* පැතිරීමල වර්ධනය යන අර්ථ ගෙන දෙන්නා වු බෘහ් (බෘහජති) වර්ධනෙ ධාතුවෙන් සෑදී ඇති බවයි. මෙම ලෝකය බ්‍රහ්මන් විසින් නිර්මිත වූවක් ලෙස අතීතයේ පටන් පිළිගත් අදහසකි. උපනිෂද් දර්ශනය තුළ අන්තර්ගත

පරමාර්ථ සත්තාව දැක්වීම සඳහා ව්‍යවහාර කෙරෙන මෙය බ්‍රහ්මන් යන්නට පර්යාය වචනයක් සේ ඎආත්මන්ꠂ යන්න බහුලව යොදා ඇති අයුරු දක්නට ලැබේ. ආත්මන් යන්නෙහි නිරුක්තිය පිළිබඳ විවිධ මත පළවී ඇත්තේ විවිධාකාරයෙන් ඒ පිළිබඳ අවධානය යොමු කර ඇති නිසාය. නමුත්, මේ පිළිබඳ බොහෝ දෙනා එකඟ වී ඇත්තේ මැක්ස්මුලර්ගේ අදහසටයි. ආශ්වාස කිරීම යන අර්ථය දෙන අන් ධාතුවෙන් ආත්මන් සෑදී ඇතැයි යන මෙම අදහස සත්‍යයට වඩාත් නැඹුරු වූවකි. ඒ ඒ පුද්ගලයා තුළ පවත්නා පෞද්ගලික වු අවිනාශී ස්වභාවය ආත්මන් යන්නෙන් බොහෝ තැන්හි දැක්වෙයි. ප්‍රාණය නොහොත් ජීව සාරය ආත්මන් බව සංහිතා අවදියේ පටන් පිළිගෙන ඇත. ඎතමාꠂ ය යන අර්ථයද පශ්චාත්කාලීනව ආත්මන් යන්නට ලැබී ඇත. ආත්මන් සහ බ්‍රහ්මන් යනු දෙකක් නොවන එකක් ම බව පශ්චාත්තන අවධියේදී පිළිගැණුනි. ඎතත් ත්වම් අසිꠂ (ඒ ඔබ වෙහි) යන්න උපනිෂදයන්හි එන ප්‍රධාන ඉගැන්වීමක් බවට පත් වුයේ එම නිසාය.

තවද අවිද්‍යාල විද්‍යාල පාරවිද්‍යාල අපරාවිද්‍යා යන වචනයන්ද කඨෝපනිෂදයෙන් අපට හමුවෙයි. විද්‍යා හෙවත් තත්ත්වාවබෝධය නොමැති විට අවිද්‍යාව වෙයි. එය ඇති බව විද්‍යාවයි. සෑම පුද්ගලයකු තුළම පවතින අවිද්‍යාවද පාරභෞතික තත්ත්වයක් වූවකි. එයද කවදා කෙසේ ඇති වූවක්දැයි විමසීමට ලක් කළ යුතු වූවක් වූවද කාලයට නිමිත්තට හේතුවට අසු නොවන හෙයින් ඒ පිළිබඳ නිශ්චිත නිගමනයක් කිරීමේ හැකියාවක් නොමැත. අවිද්‍යාව යනු මුළාවකි. සත්ත්වයා ලෝකය යනු මෙයමැයිල පරලොවක් නැත යැයි සිතන්නේත් පුත්‍රදාරාවන් පිළිබඳ බැඳෙනුයේත් වෙන කිසිම දෙයක් නිසා නොව මෙම අවිද්‍යාව හේතු කොට ගෙනය. අවිද්‍යාව හේතුකොට ගෙන ආත්මය සියලු දෙනා තුළ සැඟ වී පැවතියද එය නොපෙනෙයි. බුද්ධිමතුන් විසින් මෙය අවබෝධ කර ගැනීම සඳහා වචනය සිතෙහි සංයම කළ යුතුය. එමෙන්ම සිත බුද්ධියෙහි සංයම කළ යුතුය. බුද්ධිය ආත්මයෙහිද ඒ මහා ආත්මය ශාන්තාත්මයෙහිද සංයම කළ යුතු වෙයි.

ශාන්තාත්මය ⟵ මහාත්මය ⟵ බුද්ධිය ⟵ සිත වචනය

තමා තුළ වු ආත්මය මිනිසුන්ට නොපෙනෙන්නේ ස්වයංභූ විසින් ඉන්ද්‍රියයන් පිටතට විවෘත කර ඇති නිසාය. එහෙත් යමෙක් ඇස ඇතුළට යොමු කරන්නේ නම් අන්තරාත්මය දැක ගත හැකි වනු ඇත.

එමෙන්ම මෙම අවිද්‍යාව සසරට මූලික හේතුවක් වන අතර නැවත නැවත ඒ ඒ තැනට යාමට සත්ත්වයාට යාමට සිදුවන්නේද ඊනිසාමය. යම නචිකේතසයන් හට ධන මුළාවෙන් මුළාවුවෝ මෙලොව පමණක් ගැන සිතමින් අඹු දරුවන් පිළිබඳ ආශාවෙන් ක්‍රියා කොට නැවත නැවතත් තම වසඟයට පැමිණෙති යනුවෙන් පැවසීමෙන් පැහැදිලි වන්නේ සසර ගමන අවිද්‍යාව නිසාම සිදුවන්නක් වන බවයි. මේ අනුව කඨෝපනිෂදය සසරෙහි ස්වරූපය කවරක්ද යන්න විමර්ශනයට ලක්කර ඇත.

තවද ආත්මන් සහ බ්‍රහ්මන් ස්වරූප කවරාකාර වේද යන්න වෛදික ඉගැන්වීම් තුළ නිරන්තරයෙන් සාකච්ඡාවට ලක් වූ අතර ඒ පිළිබඳව පෙර පැවති අදහස් තවදුරටත් සංවර්ධනය කරමින් කඨෝපනිෂදය තුළ අදහස් දැක්වීමක් සිදුකර ඇත. මිනිසා මළද ඔහුගේ ආත්මය සදාකාලිකව පවත්නා බව විශ්වාස කළ හෙයින් කෙනකුගේ ආත්මය වරින්වර ඒ ඒ තැනට ගොස් ආපසු ඒමට හැකි යැයි ඔවුන් පිළිගෙන තිබුණි. විසංඥ වූ තැනැත්තකුගේ ආත්මයට ගස්වලට හෝ ගල්වලට ප්‍රවිෂ්ට විය හැකි බව ඔවුහු පිළිගත්හ. ඍග්වේදයේ එසේ විසංඥ වුවකුගේ ආත්මයට ගස්වලින්, අහසින් හෝ හිරු කෙරෙන් නැවත ඔහු වෙත පැමිණෙන්නේ යැයි කරන ලද ආයාචනයක් හමුවෙයි. මෙසේ මිනිසකුගේ අභ්‍යන්තරයේ පිහිටි "ආත්මය" කුමක්දැයි වටහා ගැනීම සඳහා කරන ලද පර්යේෂණ රැසක්ම වෛදික ග්‍රන්ථයන්හිදී හමු වෙයි. ආත්මය යනු ප්‍රාණය නොහොත් ජීව සාරයයි. "ආත්මානං විද්ධි"- ආත්මය දැනගනුව යන්න වෛදික ග්‍රන්ථයන්හි එන ප්‍රධානතම ඉගැන්වීමයි. නමුත්, "මම ඍග්, යජුර්, සාම දනිමි. එහෙත් ආත්ම නොදනිමි" (සුමනවංස හිමි, 2002: 89) මෙවැනි ප්‍රකාශන නිසා ත්‍රිවේද පාරප්‍රාප්ත වුවද ආත්මය වටහා ගෙන නොමැත්තේ නම් එම අධ්‍යාපනය අසම්පූර්ණ වන බව පෙන්වා දෙයි.

මෙසේ සියලු පුද්ගලයන් තුළ පවතින විශ්වගත ප්‍රතිෂ්ඨාව වන මෙම ආත්මය සෑම දෙයක් තුළම සැඟවී පවත්නා බව කඨෝපනිෂදය තුළින් දක්වා ඇත. සමස්ත නිර්මිතයේ ව්‍යාප්තව පවතින්නේ මෙම පරමාත්මයයි. අවදිව සිටින විටදීත්, නින්දේදීත් බන්ධනයෙහි සහ මුක්තියෙහිත් යන සියලු අවස්ථාවල නිරතුරුවම පවතින්නේ මෙය වන අතර එය සියලු ලෝක නිරීක්ෂණය කරමින් හැම තැනකම පවතින්නේය. විශ්වවේදකය මෙන්ම විශ්වවේද්‍යද එයම වේ. ගැඹුරින් විමසා බලන කල ආත්මයේ කොටස් සතරක් දැකගත හැකිය. එනම්,

1) ශාරීරික ආත්මය - ඉපදී වර්ධනය වී දිරාපත් වන අපගේ ශරීරය
2) ආනුභවික ආත්මය - ශාරීරික ආත්මයේ විවිධාකාර වු වෙනස්කම් නිසා ස්වප්නයේදී සුඛිත වී සැරිසරන්නා වු ආත්මය
3) අනුභූතිකාරක ආත්මය - තථ්‍ය ආත්මය ආනුභවික ආත්මය නොවන බව වටහා ගැනීම හේතුවෙන් ඉන්ද්‍ර ප්‍රජාපතී වෙත ගොස් මිනිසකු ශාන්තව පූර්ණ විවේකයෙන් යුක්තව සිහිනද නොදැක නිදන විට පවතින ආත්මය
4) පරමාත්මය - මෙය ආත්මයේ සත්‍ය ස්වරූපයයි. වචනයෙන් විස්තර කළ නොහැකිය.

යනුවෙනි. වෛදික යුගයේදී බාහිර ලෝකය පිළිබඳ මිනිසාගේ වැඩි අවධානය යොමු වුවද උපනිෂද් යුගය වන විට එය මිනිසාගේ අභ්‍යන්තරය වෙත නැඹුරු වෙමින් පැවතින. මිනිසා දතයුත්තේ අවට ලෝකය නොව තමන්ගේම අභ්‍යන්තරය පිළිබඳව බව අවධාරණය කෙරිණ. මන්ද තම අභ්‍යන්තරය දෙස විමසා බැලිය යුතු මිනිසා බාහිර දේ පිළිබඳ විමසිලිමත් වනුයේ ඉන්ද්‍රියයන් පිටතට විවෘතව පවත්නා හෙයිනි. එහෙත් අවශ්‍යතාව ඇති අයකුට බාහිර දේට විවෘතව පවතින ඉන්ද්‍රියයන් අභ්‍යන්තරය කරා යොමු කර ගැනීමට පුළුවන. ස්වයම්භූ තෙමේ ඉන්ද්‍රියයන් බැහැරට හැරෙනු හැකි වනු සඳහා ඉන්ද්‍රිය විවරයන් විවෘත කළේය. එමනිසා මිනිසා තමා දෙස නොබලා පිටත බලයි. කෙසේ හෝ බුද්ධිමත් අයෙක් ඇස් වසා ගෙන අමරණීයත්වය ප්‍රාර්ථනා කරමින් තමා පිටුපස සිටිනා ආත්මය දුටුහ. මෙම ඉගැන්වීම් හරහා ඉහත සඳහන් කරුණු සනාථ වේ. ආත්මය සියල්ලෙහි අධිපතියා වන බව අවධාරණය කෙරිණි. එමනිසා දෙවියන් නමින් පෙනී සිටින්නවුන් පිදීමට වඩා ජීවමාන දෙවියා වූ "ආත්මයට කරන පූජාව" උතුම්ම පූජාව බවට පත් විය.

සර්වව්‍යාපී සර්වත්‍රගත වූ ආත්මය සොයා ගැනිම එය කවරාකාර වේදැයි අවබෝධ කර ගැනීම සියලු උපනිෂද්හි මුඛ්‍යතම පරමාර්ථය වේ. අතීන්ද්‍රිය වූ ආත්මය ප්‍රත්‍යක්ෂ කර ගත යුත්තේ කවරාකාරයකින්ද යන ගැටලුව නිරාකරණය කිරීම පහසු කටයුත්තක් නොවේ. කඨෝපනිෂදයේ ඉගැන්වීම් හරහා පැහැදිලි කර දීමට උත්සාහ දරා ඇත්තේද ලෝකයේ පරම සත්තාව කෙබඳුද යන්න පෙන්වා දීමයි.

ආත්ම විශ්වාසය අනුක්‍රමණයෙන් අසහාය පදාර්ථයක් බවට පත්වීමත් මිනිසා මළ පසු ආත්මයට සිදුවන්නේ කුමක්ද යන්නත් ආත්මය මිනිසා මළද ඒ ඒ තැනට ගොස් නැවත නැවතත් උපතක් ලබා දෙන්නේ නම් එසේ නැවත නොඉපදීම සඳහා ආත්මයට කළ යුත්තේ කුමක්ද යන ප්‍රශ්නයත් මේ යුගය වන විට මිනිස් සිත තුළට ප්‍රවිෂ්ට වී තිබුණි. මේ ගැටලු සඳහා යම් පිළිතුරක් සැපයීමට කඨෝපනිෂදය උත්සාහ ගත් බව පෙනේ.

> "මරණින් මතු යහපත් තත්ත්වයකට පත්වීමට අවශ්‍ය දේ දැන ගැනීමට යොමු වූ සිතුවිලිවලින් පිරිපුන් යුගයකදී මරණයට අධිපති දෙවියා වන යමගෙන්ම මරණය පිළිබඳ විමසා නිශ්චිත නිගමනයකට එළඹීමකට යත්න දරා ඇති බව කඨෝපනිෂදයෙන් පෙනේ. කඨෝපනිෂදයේ එන ඉගැන්වීම් අනුව ආත්මය (දුර්දර්ශී) දැකීම දුෂ්කරය. (ගුඪං) ගුඪය. (අනුප්‍රවිෂ්ටං) ලෞකික වූ විෂයන්ගෙන් ඇති කරන ලද විඥාන විකාරයෙන් වැසී ඇත. (ගුහාහිතං) හදවත් ගුහාවෙහි පවත්නේය. එය වනාහී (ආධ්‍යාත්මයො හා ධීගමෙන) අධ්‍යාත්ම යෝගයෙන් දත යුතුය. ධර්මයෙන් අධර්මයෙන් මෙන්ම කළ නොකළ දෙයින්ද වෙන් වූ ආත්මය මතු සිදු වන හා සිදු වූ දෙයින්ද තොර වූවකි. එසේම එය සියලු දෙවියන්ගේත් බ්‍රහ්මචර්යාව රැක ගැනීමෙහිත් ඵලය වන්නේය. එය ඕමිය. ආත්මන්ය, බ්‍රහ්මන්ය, පරබ්‍රහ්මන්ය, ඥාතව්‍ය හා ප්‍රාතව්‍යය ද එයම වේ." (සුමනවංස හිමි, 2002, පි. 95)

ආත්මන් වනාහී ඉපදීමක් මැරීමක් හෝ නැති අන් කිසි තැනකින් පැමිණි හෝ දෙයක් නොවේ. ශරීරය නැසී ගියද ආත්මය නොනැසී පවතී.

"හන්තා චෙන්මන්‍යතෙ හන්තුං - හතශ්චෙන්මන්‍යතෙ හතම්
උභෞ තෞ න විජානීතෙතෞ - නායං හන්ති න හන්‍යතෙ" (කැකුළාවල, 1961, පි. 27)

මරන්නා මැරීමට සිතුවත් මැරුණු තැනැත්තේ මළේ යැයි සිතුවත් ඔවුහු දෙදෙනාම එය නොදනිති. හේ නොමරයි. අනිකා මරනු නොලබයි.

ඉහතදී ආත්මයේ සතරාකාරවූ ප්‍රභේදයන් පිළිබඳව සාකච්ඡා කළද කඨෝපනිෂදය තුළදී හමුවන්නේ ආත්මයේ කොටස් දෙකක් පමණි. මෙයට සතරාකාර වූ ආත්ම තත්ත්වයන්ද ඇතුළත් වේ. ඒ අනුව පහත පරිදි දැක්විය හැකිය.

1) ජීවාත්මය (ශාරීරික, ආනුභවික, අනුභූතිකාරක)
2) එරමාත්මය (පරමාත්මය)

කඨෝපනිෂදයේ සඳහන් වන ආකාරයට ජීවාත්මය යනු සසර තැනින් තැන හැසිරෙන සුලු වූ ඒ ඒ මිනිසා තුළ පවත්නා පෞද්ගලික ආත්මයයි. මිනිසාගේ අභ්‍යන්තරික ජීවය වූ මෙය කේන්ද්‍රගත වූ මිනිස් සාරයද වෙයි. මුළු මහත් ලෝකයේම වෛශ්වික පුද්ගලයකු ලෙස සැලකීම නිසා එම වෛශ්වික පුද්ගලයා හා මිනිසා අතර ඇති අනන්‍යතාව ජීවාත්මය වේ. පුද්ගලයා තුළ පවත්නා වූ මෙම ජීවාත්මය සිරුරෙන් වෙන් කර ගත හැකි නිසා එය ඒ ඒ තැන යමින් ආත්මභාව සාදා දෙන්නකු බවට පත් වී ඇත. ජීවාත්මය පියවර සතරක් මගින් ක්‍රමික පරමාත්මය හා එක් වෙයි. එම අවස්ථා නම් ජාගර, ස්වප්න, සුෂුප්ති හා තුරීයයි.

1) ජාගර = අප අවදිව සිටින විට පුද්ගලයාගේ සවිඥානය ආත්මය යැයි දැනීමයි
2) ස්වප්න = අප සිහින දකින විට දකිනුයේ ආත්මය කියන ස්වරූපයෙනි
3) සුෂුප්ති = සිහිනයකුදු නොදකින තද නින්දයි
4) තුරීය = ආත්මයේ නියම ස්වරූපයයි. වචනයෙන් විස්තර කළ නොහැකි අනුභූතියකි. චිත්තවේග තුළින් දැකගැනීමට හැකිය

පරමාත්මය මෙන්ම ජීවාත්මයද යන දෙකම ඇත්තේ හෘදයාභ්‍යන්තරයෙහිය. රථෝපමාවක් මගින් ආත්මය පිළිබඳ සිත් ගන්නා සුලු විවරණයක් කඨෝපනිෂදයේ දැක්වේ. එම උපමාවේදී, ආත්මය රථ හිමියාටත්, ශරීරය රථයටත්, බුද්ධිය රථය හසුරුවන රියදුරාටත්, සිත තෝන් ලණුවටත්, ඉන්ද්‍රියයන් අශ්වයන්ටත්, ඉන්ද්‍රියාර්ථ (රූප, ශබ්දාදිය) මහ මගටත් උපමා කොට ඇත.

> "ශරීරයෙන්, ඉන්ද්‍රියයන්ගෙන් හා මනසින් යුක්ත වූ ආත්මය සංසාරයෙහි බැඳී ගියාහු ද වෙයි. ලොව පරම සූක්ෂ්ම වනාහී පුරුෂ වේ. ඊට වඩා කිසිවක් සූක්ෂම නොවේ. 'සා කෘෂ්ටා සා පරා ගතිඃ' (I.3.ii). ආත්මඥානාවබෝධයේදී පරම සූක්ෂ්මය පිළිබඳව අවධානය යොමු කළ යුතුය. ඉන්ද්‍රියාර්ථ (රූප ශබ්දාදිය) ඉන්ද්‍රියයන්ට වඩා සූක්ෂ්මය. ඉන්ද්‍රියාර්ථයට වඩා සිත සූක්ෂ්ම වේ. සිතට වඩා බුද්ධිය සූක්ෂ්මය. ඊටත් වඩා මහත් හෙවත් ආත්මය සූක්ෂ්ම වෙයි. ආත්මයට වඩා ප්‍රකෘති සූක්ෂ්ම වෙයි. පුරුෂ වනාහී පරම සූක්ෂ්මය වෙයි. සූක්ෂ්මයේ අවසානයද එයයි." (සුමනවංස හිමි, 2013, පි. 108)

ඉන්ද්‍රිය > ඉන්ද්‍රියාර්ථ > සිත > බුද්ධිය > මහත් ආත්මය > ප්‍රකෘති > පුරුෂ

මේ අනුව පෙනී යන්නේ යුග ගණනාවක් සිටම දැන ගැනීමට සැහෙන වෙහෙසක් දැරූ පුද්ගලයකු විසින් කෙදිනක හෝ අනිවාර්යයෙන්ම දැන ගත යුතු පුනර්භවයෙන් මිදීම ළඟා කර දෙන "ආත්ම ඥානය" යථා ස්වරූපයෙන් විවරණය කිරීම සඳහා කඨෝපනිෂදය රචනා වී ඇති බවයි. ඒ අනුව පාරභෞතික විද්‍යාවකට අවශ්‍ය වන මූලික කරුණු සියල්ලක්ම පාහේ කඨෝපනිෂදයෙහි අන්තර්ගතව පවතින බව ඉහත සඳහන් කරුණු මගින් සනාථ වේ.

## ලෝක විභාගය (Cosmology)

ලෝකයේ ආරම්භයත් එහි පැවැත්මත් දර්ශනයක අඩංගු විය යුතුය. භාරතීය සෑම දර්ශනයකම ඒ වෙනුවෙන් පරිච්ඡේදයක් වෙන්ව ඇති බව දැක ගත හැකි අතර කඨෝපනිෂදය තුළද එය දක්නට ලැබෙයි. ලෝකය වනාහී බ්‍රහ්මන්ගේ නිර්මාණයක් වෙයි. සකල විශ්වයම පිළිබඳ අව්‍යාකෘත නාම රූප තත්ත්වය ආත්මන් වෙයි. ලෝකය සම්බන්ධයෙන් සියලු ශක්තීන් කැටිකොට පවතිනුයේ බ්‍රහ්මන් තුළමය. ආත්මන්/පුරුෂ යනුද එයම වෙයි. සෑම වස්තුවකම මූලික හේතුව වන්නා වූ එය සියල්ල පුරවන්නේය යන අර්ථයෙන් 'පුරුෂ' නම් වන බවද කියැවෙයි. "ස්වයම්භූ තෙමේ" සිදුරු (ඇස් කන් ආදි ඥානේන්ද්‍රියයන් හා කර්මේන්ද්‍රියයන්) පිටතට විවෘත කළේය. එහෙයින් මිනිසා බාහිර දේ දකියි. හද තුළ ඇති අන්තරාත්මය නොදකියි. එහෙත් අන්තරාවලෝකනයෙහි යෙදෙන්නා අන්තරාත්මය දැක ගනියි.

මිනිසාත් විශ්වයත් යන සියල්ලම බ්‍රහ්ම නිර්මිතයක් බව බොහෝ ඉන්දියානු දර්ශනවල පිළිගත් කරුණකි. එමෙන්ම කඨෝපනිෂදයට අනුව මිනිසා සිය සිරුර තුළ වූ අන්තරාත්මය නොදකින්නේ තම ඉන්ද්‍රියයන් බාහිර දෑ දැක්මට මිස අභ්‍යන්තරය දැකීමට යොමු කර නැති හෙයිනි. උත්සාහ වඩන්නා හට අපහසුවෙන් වුවද එය දැකගැනීමට පුළුවන. "බ්‍රහ්මන් වනාහී ලෝකාධිපතිය" ලෝක පාලකයාය. ලොව සියල්ල සිදුවන්නේ අන්කවරෙකුගේවත් නොව ඔහුගේ විධාන මතය. ඔහුගේ කැමැත්තෙන් තොරව කිසිවකුට කිසිවක් කළ නොහැකිය. හිරු සඳු පවා බබලන්නේ ඔහුගේ අණ පරිදිය.

විෂය ලෝකය ක්‍රියාත්මක වන්නේද බ්‍රහ්මාධිපත්‍යය යටතේය. මෙහිදී සසර වෘක්ෂයකට තුලනය කරමින් දක්වන අදහස අවධානයට යොමු වේ. "මුල් උඩට පිහිටි අතු පහළට ඇති මේ ඇසතු රුක සදාතනිකය. එය පිරිසිදු වූවකි. එයම බ්‍රහ්මන්ය. අමෘතයයි. සියලු ලෝ වැසියෝම එහි රැඳුණි. කිසිවකුටවත් ඉන් ඔබ්බට යා නොහැක. මෙම සංසාර වෘක්ෂය අව්‍යාකෘතයෙහි පටන් සියලු ස්ථාවර දෑ වෙත විහිදී ඇත. අවිද්‍යාව, කාම, කර්ම, අව්‍යක්ත බීජවලින් හටගනී..." (සුමනවංස හිමි, 2002, පි. 99) ආදි වශයෙන් දක්වා ඇත. මේ අනුව වේදාන්තයෙහි කියවුණු බ්‍රහ්මාත්ම යන්න දර්ශනය නැමැති කඩුවෙන් කපා හෙළනු ලැබෙයි.

මෙම බ්‍රහ්මන් වනාහී සියලු ලෝකයන් තුළ පැතිර පවතින්නක් බව ඉහත සඳහන් කරුණු මගින් තහවුරු වේ. සියල්ල බ්‍රහ්මන් වන අතර බ්‍රහ්මන් සියල්ලද වෙයි. හිරු නගින්නේද අස්තයට යන්නේත් දෙවිවරුන් පිහිටා සිටින්නේත් එතුළමය. බ්‍රහ්මන්ට අසු නොවූ කිසිවක් කිසිදා නොමැත. මිනිසුන් තුළ දෙවියන් තුළ සත්‍යයෙහි, යඥයෙහි, අහසෙහි, පොළොවෙහි ආදි සෑම තැනකම පැතිර පවතින්නේ බ්‍රහ්මන් බවද දක්වා ඇත.

විවිධ වූ ලෝකයන් පිළිබඳවද කඨෝපනිෂදයෙහි එන ලෝක විභාගයේදී අවධානය යොමු වී ඇත. මෙලොව, ස්වර්ග ලෝකය හා යම ලෝකය යන ලෝක තුනක් පිළිබඳව මුලදීම කරුණු හමුවෙයි. ඒවායින් ස්වර්ග ලෝකය කිසිදු බියක් නොමැති ජරා ව්‍යාධි ආදියෙන් තොර කුසගින්න සා පිපාසාදි වේදනාවෙන්ද විනිර්මුක්ත ස්ථානයකි. මරණින් පසු මෙලොව වැරදි කරන්නන් යන ලෝකය යම ලෝකයයි. යම එහි අධිපතිවරයාය. ඍග්වේද යුගයේ සිට මෙම යම පිළිබඳ විශ්වාසය ගොඩනැගී පැවතුණි. මේ යුගය වන විට යමට වෙනම ලොවක අධිපතිත්වයක් පවරා ඇති බව "යම ලොව" පිළිබඳ විස්තර තුළින් පැහැදිලි වන්නකි.

යමෙක් මෙලොවදී යාගහෝමාදි පුණ්‍ය ක්‍රියාවන් සිදු කරයිද ඔහු එහි ප්‍රතිඵල පරලොවදී ලබයි. මෙලොවදී සිදු කරන ලබන එවැනි ක්‍රියාවන්හි ප්‍රතිඵලය ලබන ස්ථානය වන්නේ "පිතෘ ලෝකයයි." යමකු ආත්ම දර්ශනය සඳහා ගනු ලබන උත්සාහ සම්පූර්ණයෙන්ම සාර්ථක නොවන විටකදී අතරමග නවතින තැනක් ලෙස පිතෘ ලෝකය සලකනු ලැබේ. මෙහිදී සිහිනයක් තුළ සිටින තමා මෙන් ආත්ම දර්ශනය වෙයි.

ගාන්ධර්ව ලෝකයද පිතෘලෝකයට වඩා ඉහළින් ඇත්තක් ලෙස හැඟෙයි. එයද ආත්ම ගවේෂණ මාර්ගයට පිළිපන් අය සිය උත්සාහයන් මෙලොවදී සාර්ථක නොවුණහොත් යාමට සිදු වන ලොවක් ලෙස කරුණු දක්වා ඇත. දියෙහි ඡායාව සේ මෙහිදී ආත්මය දර්ශනය වේ. ලෝකයන් අතර උසස්තම ලෝකය බ්‍රහ්ම ලෝකයයි. එහි යෑමට හැකි වන්නේ බ්‍රහ්මන් අවබෝධ කරගත්තකුට පමණි. එය අවබෝධ කරගත හැක්කේද මෙලොවදීම පමණක් වෙයි (සුමනවංස හිමි, 2002).

කඨෝපනිෂදයෙහි ඉගැන්වෙන සමස්ත දර්ශනයම ගොඩනැගී ඇත්තේ සසර ගමන නවතාලීමේ අපේක්ෂාව ඇතිවය. නචිකේතස් තුන්වන වරය ඉල්ලා සිටින්නේද මරණින් මතු සිදුවන්නේ කුමක්දැයි පහදා දෙන ලෙසටය. මිනිසා මළ පසු ඔහු ඇතැයිද නැතැයිද යන්න සැක සහිත හෙයින් එය විසඳා ගත යුතු වෙයි. මරණින් පසු ඒ ඒ තැන්හි උප්පත්තිය ලබමින් සසර දිගු ගමනක් යාමට සිදුවන හෙයින් එය කෙටිකර ගැනීම සඳහා මෙහි එන ආත්ම දර්ශන ක්‍රමය උපයෝගී කරගැනේ. සසර ගමන පිළිබඳ නොදියුණු භව සංක්‍රමණවාදී අදහස් ඔස්සේ විස්තරයක් කඨෝපනිෂදයේ හමු වෙයි. එනම්, මරණින් පසු ආත්මය සිරුරක් ලබා ගැනීම සඳහා යෝනියකටද නිශ්චල වස්තුවලටද (ගස්, ගල්, පර්වත) පිවිසෙන බවයි.

විද්‍යා අවිද්‍යා දෙක පැහැදිලි කරමින් අවිද්‍යාව නිසා මුළා වූ අය සසර දුගතීන්හි සැරිසරන බව දක්වා තිබීමෙන් අවිද්‍යාව සසර ඒ ඒ තැන හැසිරීමට සත්ත්වයා මෙහෙයවන ප්‍රධාන කරුණක් වන බව කඨෝපනිෂදයේ පෙන්වා දෙයි. හොඳ දෙය යනු "පරා විද්‍යා" නමින්ද හැඳින්වෙන ආත්ම විද්‍යාවයි. එය ලබා ගැනීමට බලවත් පරිශ්‍රමයක් දැරිය යුතු හෙයින් යම් කෙනකු කාම සම්පත් කෙරෙහි ඊට වඩා ප්‍රිය විය හැකිය. ලෞකික ජීවිතයේදී වුවද ප්‍රිය දේ හැම විටකම හොඳ දේ නොවේ. රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන කාම වස්තූන් පිළිබඳවද සහජ ආශාවක් සත්ත්වයාගේ සිත් තුළ පවත්නා නිසා ඒවා ප්‍රිය ලෙස බොහෝ පුද්ගලයෝ පිළිගනිති. යම නචිකේතස් හට ගවමහිෂාදි ප්‍රිය වස්තූන් පරිත්‍යාග කිරීමට ඉදිරිපත් වූයේද එම නිසාය. ඉපදීම මැරීම වධ වේදනා රහිත පරම ශාන්ත වූ එම තත්ත්වය වටහා ගැනීමට තමාට ප්‍රිය වුවත් අප්‍රිය වුවත් හොඳ දේ පමණක් තෝරා ගෙන ඒ අනුව පිළිපැදීම කළ යුතුය. ප්‍රිය දේ සසර දිගු වීමට හේතු වන අතර හොඳ දේ සසරෙන් එතෙර වීමට උපකාර වේ.

පූර්වයෙන් සඳහන් කළ විවිධ ලෝක පිළිබඳ දැක්වෙන ඉගැන්වීම් තුළින් ලෝක විභාගයට අවශ්‍ය මූලික අඩිතාලම වැටී ඇත්තේ සංසාරය පදනම් කරගෙනය යන්න මින් පැහැදිලි වේ. මරණින් මිනිසාගේ අවසානය සිදු නොවේ. ඊට හේතුව ශරීරය විනාශයට පත් වුවද ඔහු තුළ පවත්නා ආත්මය එසේ විනාශ නොවන නිසාවෙනි. අමෘතත්වය ලබා ගැනීම කඨෝපනිෂදයේ එන ප්‍රධාන පරමාර්ථයයි. සසර ගමන අවසන් වන්නේ එහිදීය (සුමනවංස හිමි, 2002).

## ඥාන විභාගය (Epistemology/ Theory of Knowledge)

ඥාන විභාගය, ඥානය නැතහොත් දැනීම පිළිබඳවද අවධානය යොමු වී ඇත. මේ අනුව කඨෝපනිෂදයේ එන ඥාන විභාගය හරහා උත්සාහ දරනුයේ මිනිසාට ඥානය ලැබෙන්නේ කවරාකාරයෙන්ද පැහැදිලි කර ගැනීමටය. ඥාන විභාගය යන්න දර්ශන ක්ෂේත්‍රයේ සාකච්ඡාවට බඳුන් වූ ඉතා වැදගත් මාතෘකාවකි. උපනිෂද් යන වචනයෙන් අදහස් වන්නේ ගුරුවරයකු තම සිසුන් අතුරින් වඩාත්ම දක්ෂ ශිෂ්‍යයා වෙත කියා දෙනු ලබන රහස්‍ය වූ දැනීමය. කඨෝපනිෂදයේ දැක්වෙන පරමාර්ථය බ්‍රහ්ම ඥානය හෙවත් ආත්ම දර්ශනය වන අතර එය එහි ඥාන ගවේෂණ මාර්ගයද වේ.

'විද්‍යා හෝ අවිද්‍යා, දැනීම හා නොදැනීම යන කරුණු දෙකම මෙමගින් විස්තර කෙරේ. අවිද්‍යාව යැයිද විද්‍යාව යැයිද යන කරුණු ද්විත්වයම දුරින්ම දුරය. මන්ද මෙම කරුණු දෙක එකිනෙකට වෙනස් අතකට යොමුව පවත්නා නිසාය. මුළාවෙහි වූ පිරිස් අවිද්‍යාවේම රැඳමින් තමාම නුවණැතිය, පණ්ඩිත යැයි සිතමින් අන්ධයකු විසින් මග පෙන්වන්නා වූ අන්ධයන් මෙන් කුළිට වූ දුගතියෙහි හැසිරෙමින් සෑම තැනම සංචාරය කරයි.' මෙසේ කඨෝපනිෂදය තුළින් පැහැදිලි කර ඇත්තේ අවිද්‍යාව නිසා සත්ත්වයා සසර භවයෙන් භවයට යාමට අවශ්‍ය දෑ සිදු කරන අතර ඒ තුළින් දුගති හා සුගතීන්හි ඉපදීමට සිදුවන ආකාරයත්ය. එමනිසා පුද්ගලයා අවිද්‍යාව වටහා ගෙන සසර ගමන නැවැත්වීම මෙහි දක්වා ඇති ප්‍රධාන ඉගැන්වීම වන බවයි.

උපනිෂද් චින්තනය තුළ ඥාන ක්ෂේත්‍ර දෙකක් දැක ගත හැකිය. එනම් අපරා විද්‍යාව හා පරා විද්‍යාවයි. කඨෝපනිෂදයෙහි අපරා විද්‍යාව පහත් මට්ටමක පැවතියද බ්‍රහ්ම ඥානය පිළිබඳ දැනීම් මාත්‍රයක් ඉන් අදහස් කෙරෙන අතර පරා විද්‍යාව බ්‍රහ්ම ඥානයම වෙයි.

ඥානය යන්න හැඳින්වීම සඳහා කඨෝපනිෂදයෙහි භාවිත කර ඇත්තේ විද්‍යාව සහ අවිද්‍යාව යන නම්ය. විද්‍යාව යනු ශ්‍රේෂ්ඨතම බ්‍රහ්ම ඥානාවබෝධයයි.

කඨෝපනිෂදය තුළ එන වාජශ්‍රවස් හා නචිකේතස් යන සංඥා නාම දෙකම ඥානයට සම්බන්ධයක් ඇති බව දැක්වේ. ශඞ්කරාචාරීන් වාජශ්‍රවස් යන්න විස්තර කරනුයේ "වාජමන්නං තද්දානාදි නිමිත්තං ශ්‍රවෝ යශො යස්‍යසඃ වාජශ්‍රවඃ රූඪීතෝවා තස්‍යාපත්‍යං වාජශ්‍රවසඃ." (සුමනවංස හිමි, 2002, පි. 103) යනුවෙනි. වාජ යනු ආහාරයයි. දන්දීම නිසා කීර්තිය ලද තැනැත්තා වාජශ්‍රවස් යනුවෙන් හඳුන්වයි. ක්‍රිෂ්ණ ජෙම් මෙය විග්‍රහ කර ඇති පරිදි වාජ යනු ආහාරයයි. ශ්‍රවස් යනු මහ හඬයි. අය යනු ලද දෙයකි. ඔහුට අනුව වාජශ්‍රවස් යනු කාලාන්තරයක් මුළුල්ලේ අසනු ලැබූ මුඛ පරම්පරාවෙන් ගෙන ආ විශ්වයේ ජීව ශක්තියයි.

තවද මෙහි පවත්නා දාර්ශනික වැදගත්කමක් සහිත සංකල්පයක් වන පුනර්භවය පිළිබඳ ඥානයක් පිළිබඳ කඨ උපනිෂදයට ව්‍යාඛ්‍යානයක් සපයමින් ශඞ්කරාචාරීන් පවසා ඇත. ඔහු දක්වන්නේ වාජශ්‍රවස් විසින් පවත්වන ලද විශ්වජිත් නම් වු සියල්ල දන් දීමෙන් ඔහු බලාපොරොත්තු වූයේ "ආස්තික්‍ය" බුද්ධිය නම් වූ පුනර්භවය පිළිබඳ ඥානයක් වන බවයි.

දැනීම පිළිබඳව අවස්ථා කිහිපයක් පිළිබඳව මෙහිදී අවධානයට ලක් කළ හැකිය.

1) යෝගක්ෂේම අවස්ථාව = තමා සතු දෑ රැකගැනීමට පමණක් දන්නා වූ නුවණ
2) තර්ක ඥානයෙන් ලබාගන්නා වූ නුවණ
3) උනුන්ගෙන් අසා ගැනීමෙන් ලබාගන්නා වූ නුවණ
4) අධ්‍යාත්මයෝගාධිගමයෙන් ලබන නුවණ

අන්‍යන්ගෙන් අසා ලබා ගන්නා වූ ඥානය සම්පූර්ණ විමේ අවස්ථා තුනකි. එනම්,

1) ඇසීම - ශ්‍රවණය
2) අවබෝධය - පරිග්‍රහණය
3) ආත්මීකරණය

යනුවෙනි. තවද ගුරු මුඛයෙන් අසා දැනගැනීම උසස් ලෙස පිළිගෙන තිබුණි. ගුරු ශිෂ්‍ය සබඳතාව මත උපනිෂද් දර්ශනයම ගොඩනැගී ඇත්තේ ඒ නිසාය. ගුරුවරුන්ද කොටස් තුනකින් යුක්ත වෙයි.

1) ඥානාවබෝධය ලබා ගෙන සිසුන්ට ද එය පැහැදිලි කරදෙන ගුරුවරුන්
2) ඥානාවබෝධය ලබා ගෙන එය අන් අයට පහදා නොදෙන ගුරුවරුන්
3) ඥානාවබෝධය ලබා නොගෙන එය ලබා ගැනීමේ මාර්ගය පහදා දෙන ගුරුවරුන්

නචිකේතස් යම සමීපයට ගොස් ඉල්ලා සිටින දෙවන වරය වන්නේ ස්වර්ග සාධක වූ අග්නිය පිළිබඳව තමාට කියාදෙන ලෙසයි. 'ඔබ එය දන්නෙහිය. මටද කියාදෙන්න යන ඉල්ලීමට යම පිළිතුරු දෙන්නේ මම එය දැන ගෙනම ඔබට ප්‍රකාශ කරමි' යනුවෙනි. මෙය දැනගෙනම ප්‍රකාශ කරන බව ධ්වනිත කිරීමකි.

ශිෂ්‍යයා යමක් ඉල්ලා සිටි පමණින්ම ගුරුවරුන් කියා දීම සිදු නොකළ බවද දක්නට ලැබෙයි. එනම්, නචිකේතස් මරණින් මතු තත්ත්වය කවරේදැයි යමගෙන් විචාළ කල්හි යම ඔහුට ශතවර්ෂායුෂ්ක දුදරුවන්ද ගව මහීෂාදියද අනේකවිධ සම්පත්ද දෙන බවට පොරොන්දු වීම පිළිබඳ නොවිමසන ලෙස පවසා තිබීමෙන් එය පෙනෙයි. ශිෂ්‍යයා එම කාම සම්පත් වලින් ආශාවෙන් පෙළීම අවසන් වන බව ප්‍රත්‍යක්ෂ කළ පසු "බ්‍රහ්ම ඥානය" පිළිබඳ කරුණු ඔහුට කියා දී ඇති බව පෙනේ.

කරුණු පැහැදිලිව ප්‍රකාශ කිරීම දැනුම ලබා දීම සඳහා උපයෝගී කරගත් තවත් මාර්ගයකි. කඨෝපනිෂදයේදී බ්‍රහ්ම ඥානයේ ස්වරූපයත් එය ලබා ගත යුතු අයුරුත් ඒ සඳහා පිළිපැදිය යුතු මාර්ගත් අවසන් ප්‍රතිඵලය ලැබුණු පසු උදා වන තත්ත්වයත් යන කරුණු මේ යටතේ විස්තර වෙයි. උපමා, උපමේය, සමානාර්ථ පද ආදිය යොදා ගැඹුරු කරුණු සරල ලෙස අර්ථ දක්වා තිබීම බහුල ලෙස භාවිතා වී තිබේ. උදාහරණයක් ලෙස "ආත්මය රථ හිමියා ලෙසත් ශරීරය රථය මෙන්ද සිත තෝණ නූල මෙන්ද දැනගන්න" (සෙනෙවිරත්න, 2007, පි. 176) යැයි පැවසීම දැක්විය හැකිය.

අපෝහ ක්‍රමය (Dialectical method) කඨෝපනිෂදයේදී ඥාන විභාගය සඳහා උපයෝගී කරගෙන තිබේ. එය මෙය නොවේ, මෙයත් නොවේ යනුවෙන් දැක්වෙන මෙම ක්‍රමය නේති න්‍යාය ලෙසද විස්තර වෙයි. බ්‍රහ්මන් (ආත්මන්) වනාහී මිනිසාගේ භෞතික ඉන්ද්‍රියයන්ට අරමුණු වන සියලු දෙයින් ඉදිරියට යාමක් බවත් එය මනසින් වටහා ගත යුතු උතුම්ම තත්ත්වයක් බවත් කඨෝපනිෂදයෙන් ගම්‍යමාන වෙයි. කඨෝපනිෂදයෙහිදී ද කතුවරයා තම ඉගැන්වීම් හරහා පෙන්වා දෙන්නේ බ්‍රහ්මන් (ආත්මන්) අවබෝධය අතීන්ද්‍රිය සත්තාවක් බවයි. බ්‍රහ්මන් නම් වචනයෙන් හෝ මනසින් හෝ ඇසින් හෝ දෘෂ්ටියෙන් දත නොහැක්කකි. ඇතැයි පවසනුන් හැර අනන්‍ය වූවකු කෙසේ එය ලබා ගනීද? මෙවැනි ඉගැන්වීම් හරහා පෙනීයන්නේ නාස්ත්‍යාත්මක ක්‍රමය සත්‍යාවබෝධයට බෙහෙවින් උපකාර වන බවයි. මිනිසකුගේ ඉන්ද්‍රියයන්ට විෂය වන්නේ ඉපදෙන මැරෙන ස්වභාවය ඇති වෙනස්වන නිත්‍ය නොවූ දේ පමණි. විපශ්චිත් තෙමේ (ආත්මන්) ඒ සියලු තත්ත්වයන් ඉක්මවුවකු ලෙස මෙහි විස්තර කර ඇත. මෙම අපෝහ ක්‍රමය නිර්වාණය කවරාකාර වේද යන්න පැහැදිලි කිරීම සඳහා බුදු දහමේ ද යොදා ගෙන ඇති බව අජාතං, අභූතං, සංඛතං ආදි වචනයන්ගෙන් පෙන්වා දිය හැකිය.

ඉහත සඳහන් ඉගැන්වීම්වලට අවධානය යොමු කිරීමේදී පෙනී යන්නේ ඥාන විභාගය සඳහා අපෝහ ක්‍රමය බෙහෙවින් යොදා ගෙන ඇති බවයි.

මීට අමතරව කඨෝපනිෂදය තුළ එන ඥාන විභාගීය ක්‍රමය බොහෝවිට උද්ගාමී ක්‍රමයට (දත් දෙයින් නොදත් දෙය කරා යාමට) අනුකූල වන්නකි. හැම කෙනකුම මරණයට පත්වන බව දනියි. ඉන්පසු ඔහුට වන්නේ කුමක්ද යන්න බොහෝ කාලයක පටන් ගවේෂකයින්ගේ විවාදයට ලක් වූවක් වන අතර මෙය කඨෝපනිෂදයේ ආරම්භයේ පටන්ම අපට හමුවන්නකි.

> "යෙයං ප්‍රෙතෙ විචිකිත්සා මනුෂ්‍යෙ - ස්තීත්‍යෙකෙ නායමස්තීති චෛකෙ
>
> එතද් විද්‍යාමනුශිෂ්ටස්ත්වයාහං - වරාරණාමෙෂ වරස්තෘතීයඃ" (කැකුළාවල, 1961, පි. 11)

අපගේ ශරීරය අපි දන්නෙමු. ශරීරය තුළ අශරීරය වූයේ කුමකින්දැයි දැන ගත යුතු වේ. අනිත්‍යය තුළ පවත්නා නිත්‍ය වූව දැන ගත යුතුවෙයි. ගින්න සහ සුළඟ ඒ ඒ තැනට ගොස් ඒ ඒ දෙයෙහි ස්වරූපයන් ගනියි. ඒ ප්‍රත්‍යක්ෂ කරුණු තුළින් අප විසින් යොමු විය යුත්තේ නොදන්නා ආත්මයේ ස්වරූපය අවබෝධ කර ගැනීමටය. ආත්මය ඒ ඒ වස්තූන් තුළට ප්‍රවිෂ්ටව ඒ ඒ දෙයෙහි ස්වරූපයටම පත් වන බව ඒ ප්‍රකාශයෙන් ධ්වනිත වේ. ආත්මන් බාහිර දෙයින් ක්ලිෂ්ටත්වයට පත් නොවන අයුරු වටහා දීමටද මෙහිදී උපයුක්තව ඇත්තේ උද්ගාමී ක්‍රමයමය (සුමනවංස හිමි, 2002). මේ අයුරින් උද්ගාමී ක්‍රමයෙන් අප ලබන ඥානය රහස්‍ය වූවකි.

තර්කය තුළින් බ්‍රහ්ම ඥානය වටහා ගත නොහැකි බව කඨෝපනිෂදයේ ඇති වැදගත් කරුණකි. තර්ක ඥානය ඉක්මවා ගිය මෙම බ්‍රහ්මන් වටහා ගත හැකි වනුයේ පංචේන්ද්‍රයයන් මනස සමඟ නිශ්චලත්වයට පත්කොට භාවනාමය ප්‍රඥාවෙන්මය. ඥාන විභාගය සඳහා බොහෝ දර්ශනයන් තුළ උපයෝගී කර ගන්නා ප්‍රත්‍යක්ෂය, අනුමානය, උපමානය, ශාබ්ද යන ක්‍රම චතුෂ්කයම මෙහිදී ද භාවිත කර ඇත.

> "නෛෂා තර්කෙන මතිරා පනෙයා - ප්‍රොක්තාන්‍යෙ නෛව සුඥානාය ප්‍රෙෂ්ඨ
>
> යාං ත්වමාපඩ සත්‍යධෘතිර් බතාසි - ත්වාදඞ් නො භූයාන්නචිකෙතඞ ප්‍රෂ්ඨා" (කැකුළාවල, 1961, පි. 22)

මේ ඥානය තර්කයෙන් ලද නොහැකිය. ප්‍රියතමය.එය මැනවින් දත හැක්කේ අනෙකකු ප්‍රකාශ කළ කල්හි පමණි. එය තෙපි ලැබුවාහුය.

අඞ්ගුෂ්ඨමාත්‍රාව අන්තරාත්ම වූ පුරුෂ සිය ශරීරයෙන් බැහැර කරලීම මෙලොවදීම බ්‍රහ්මන් ප්‍රත්‍යක්ෂ කිරීම වෙයි. එමෙන්ම චක්ෂුර් ගෝචර නොවූ බ්‍රහ්මන් මනඃපාලක වූ හෘද්ගත වූ බුද්ධි සමාධානයෙන් දැක ගත හැකිය. යම් අවස්ථාවක පංචේන්ද්‍රියයන් මනසත් සමග නිශ්චලව සිටිත්ද බුද්ධිය අවයවවලද එවිට බ්‍රහ්මන් ප්‍රත්‍යක්ෂ වේ.

ප්‍රත්‍යක්ෂයේ කොටස් දෙකක් මෙහිදී දැකගත හැකිය. එනම්, සාමාන්‍ය ප්‍රත්‍යක්ෂය සහ අතීන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය යනුයි.

මීට අමතරව ඉන්ද්‍රිය විෂය නොවූවක ස්වරූපය ඉන්ද්‍රිය විෂයට ගෝචර වන වස්තුවක් ඇසුරින් අනුමාන කළ හැකිය. "අනිත්‍යයෙහි නිත්‍යය ශරීරයෙහි අශරීරය ලෙස බ්‍රහ්මන් දැනගන්න" සූර්යයා බාහිර වස්තූන් ප්‍රකාශයට පත් කළත් එම වස්තූන්හි අපවිත්‍රත්වයෙන් කිලුටට පත් නොවන්නාක් මෙන් බ්‍රහ්මන් ඒ ඒ වස්තූන්ට පිවිසියත් ඒවායේ ගැටීමෙන් වෙනසකට පත් නොවේ. මේ අනුව බ්‍රහ්මන් පවත්නා ආකාරය පිළිබඳව අපගේ අත්දැකීම් ඇසුරින් අනුමාන ඥානයක් ලද හැකිය. එමෙන්ම අතීන්ද්‍රිය වූ පරම සත්තාව පිළිබඳව අපගේ අත්දැකීම් ඇසුරින් අනුමාන ඥානයක් ලද හැකිය. එමෙන්ම අතීන්ද්‍රිය වූ පරම සත්තාව පිළිබඳ හැඟීමක් කළ හැක්කේ උපමානය ආශ්‍රයෙනි. "ආත්ම රථොපමාව" එවැන්නකි. ශාබ්ද හෙවත් ආප්ත වචනයද ඥානය ලබාගැනීමට උපකාර වෙයි. "ඇසීමට පවා දුර්ලභ ආත්මය යමෙක් ප්‍රකාශ කරයිද හෙතෙම ආශ්චර්යවත් වේ" යනුවෙන් දක්වා තිබීමෙන් එය පැහැදිලි වෙයි.

## මනෝ විද්‍යාව (Psychology / Philosophy of Mind)

මනෝ විද්‍යාව යනු මනස පිළිබඳ හදාරන විද්‍යාවයි. ඒ අනුව උපනිෂද්හි මෙය "ආත්ම විද්‍යාව" නමින් විස්තර කරනු ලබයි. නූතනයේ බොහෝ විද්වතුන් ගේ අවධානයට ලක් ව ඇති මනෝ විද්‍යාව ආත්මයක් පවතින බව විශ්වාස නොකරයි. මනෝ විද්‍යාව යන්න ආත්ම සහ විද්‍යා යන වචන ද්විත්වයෙන් නිර්මිත වූවක් ලෙස පිළිගනී.

ජීවාත්ම සහ පරමාත්ම වශයෙන් ආත්මයේ කොටස් පවතී. ජීවාත්මය යනු පුද්ගලයාගේ ශරීරය තුළ පවත්නා වූ ආත්මයයි. ප්‍රත්‍යගාත්මය යනුද මෙයයි. එය ඉපදීමක් මැරීමක් නැති ශාස්වත වූවකි. එසේම එය වඩා සියුම්ද මහත් දෙයට වඩා මහත්තරද වූවකි. කඨෝපනිෂදයෙහි මෙම ජීවාත්ම සහ පරමාත්මය හැඳින්වීම සඳහා "ඡායාත්‍ය" යන්න භාවිතා කරයි. ඡායා යනු සෙවනැල්ලය. ජීවාත්මය වනාහි විශ්වාත්මය වන අතර එයින් මනස් හා ඉන්ද්‍රියයන් ග්‍රහණය කර ඇති හෙයින් භෝක්තෘ ස්වරූප වූ ජීවාත්මය ඇති වී තිබේ.

ආත්මය මගින් මිනිසා රූප, ශබ්ද, ගන්ධ, රසාදිය දැන ගනියි. ඔහුගේ ප්‍රාණය දරනුයේද කර්ම ඵල භුක්ති විඳිනුයේද එම ආත්මයයි. බ්‍රහ්මන්ගෙන් ප්‍රථමයෙන්ම උපන් මෙම ප්‍රත්‍යගාත්මය සියලු සතුන්ගේ හෘර්දයාභ්‍යන්තරයට පිවිස පංචමහා භූතයන් සමග සිටියි. සූර්යයා නගින්නේත් බහින්නේත් සියලු දෙවිවරුන් සිටින්නේත් පරමාත්මය තුළ වන හෙයින් එය සර්වව්‍යාපීය. දෙව්ලොව හිඳින සූර්යයාත් අහසෙහි පවත්නා වායු ධාතුවත් වේදයෙහි ගින්නත් ගෘහයෙහි ආගන්තුකයාත් යන සියල්ලම අනිකක් නොව එකම පරමාත්මයක් වෙයි.

මිනිසා තුළ පවත්නා මෙම ආත්ම දැකීම සඳහා කළ යුතු වන්නේ සුක්ෂ්ම දේ වඩා සුක්ෂ්ම දෙයෙහි සංයමය කිරීමය. ඉන්ද්‍රියාර්ථයන් ඉන්ද්‍රියයන්ට වඩා සුක්ෂ්ම වෙයි. එහෙයින් වචනය සිතෙහිද සිත බුද්ධියෙහිද බුද්ධිය මහත් ආත්මයෙහිද මහත් ආත්මය ශාන්ත ආත්මයෙහිද සංයමය කළ යුතු වෙයි.

අනෙකුත් උපනිෂද් කෘතිවල මෙන්ම කඨෝපනිෂදයෙහිද ප්‍රාණය ගැන සඳහන් වෙයි. මෙය ජීවමය නොවේ. ප්‍රාණ වෘත්තිය වායුවයි. ශාරීරික ක්‍රියාකාරීත්වය සිදුවනුයේ ප්‍රාණ, අප්‍රාණ, සමාන, උදාන හා ව්‍යානවය යන පංචවිධ වායූන් ආශ්‍රයෙනි. ප්‍රාණය මෙහෙයවනු ලබන්නේ ආත්මය විසිනි. ඉන්ද්‍රිය ක්‍රියාකාරීත්වය "ප්‍රාණ" යන්නෙන් අදහස් වන බවද විද්වතුන්ගේ පිළිගැනීම වෙයි (සුමනවංස හිමි, 2002, පි. 110).

තවද පරබ්‍රහ්මන් ඉන්ද්‍රියයන්ගෙන් නොව මනසින්ම දත යුතු බව දක්වා තිබීමෙන් මනසේ උසස් බව පිළිගෙන ඇති බව පෙනෙයි (කැකුළාවල, 1961). මනස හික්මවා ගැනීම යනු අන් සියලුම ඉන්ද්‍රියයන් හික්මවා ගැනීම වේ. ඉන්ද්‍රියයන්ට ගොදුරු වන ඉන්ද්‍රියාර්ථයන් පිළිබඳ හැඟීම ඇතිකර ගනුයේ මනස මගිනි. යමක් වටහා ගැනීමට මනස අවශ්‍ය හෙයින් එය සංජානන ඉන්ද්‍රියයද වෙයි. රූපය ඇසටද ශබ්දය කණටද වන පරිදි අරමුණු අදාළ ඉන්ද්‍රියයන් කරා යොමු කරනුයේද මෙමගින් වන හෙයින් "මධ්‍යවර්තී" ඉන්ද්‍රිය ලෙස මනස විග්‍රහ කිරීමටද හැකියාව ඇත. ඉන්ද්‍රියයන් තිබුණද ඒවාට අරමුණු ලද විට ඒ පිළිබඳ ඉන්ද්‍රිය ඥානය ඇතිවන්නේ මනස තුළය. ඇසත් රූපයත් හේතුවෙන් චක්ෂු විඥානය උපදී. "චක්ඛුං ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං" (සුමනවංස හිමි, 2002, පි. 111) ලෙස බුදු දහමේද මනස මධ්‍යවර්තී ඉන්ද්‍රියයක් ලෙසත් සංජානන ක්‍රියාවලියේ ප්‍රමුඛතම ඉන්ද්‍රියයක් ලෙසත් දක්වා ඇත.

රැහැනින් බැඳ අශ්වයා රියදුරාට අවශ්‍ය ස්ථානයක් වෙත යොමු කළ හැකිය. ඉන්ද්‍රියයන්ට දුෂ්ට වූ විට හෝ නොහික්මුණු අවස්ථාවන්හිදී හික්මවා ගැනීමට ඇති රැහැන බවට මනස බවට පත් වේ. රූප ශබ්දාදි විවිධ අරමුණු කරා අදින ඉන්ද්‍රිය නැමැති තුරඟුන්ගෙන් යුත් ශරීරයේ තෝන් ලණුව මනස බව කඨෝපනිෂදයේදී ප්‍රකාශ කෙරේ (ධර්මකීර්ති හිමි සහ පඤ්ඤාලෝක හිමි, 1950). ඒ අනුව ඉන්ද්‍රිය සංවර අසංවර දෙක පිළිබඳව ප්‍රධාන වගකීම පවරනුයේ මනසටය. මෙහිදී පංචේන්ද්‍රියයන් මනස හා නිශ්චල කර ගැනීමෙන්ම ඉහල තත්ත්වයකට ළඟා විය හැකිය.

"යදා පඤ්චාවතිෂ්ඨන්තෙ - ඥානානි මනසා සහ

බුද්ධිශ්ච න විචෙෂ්ටති - තමාහුඃ පරමාං ගතිම්" (කැකුළාවල, 1961, පි. 59)

ඉන්ද්‍රිය සංවර වූ විට මානසික ඒකාග්‍රතාවද ඇති වන අතර එම ආත්ම දර්ශනය සඳහා "ආධ්‍යාත්ම යෝගය" අවශ්‍ය වෙයි. එනම් පංචේන්ද්‍රියයන් විෂය ලෝකයෙන් ඈත් කර ආධ්‍යාත්මය වෙත නැඹුරු කර ගැනීමයි. මනසේ උපයුක්තතාව මෙහිදීද අවධාරණය වේ. ඒ සිත හික්මවා ගැනීමකින් තොරව ඉන්ද්‍රියයන් ඉන්ද්‍රියාර්ථයන් කරා ආකර්ෂණය වීම වළක්වා ගැනීමට අපහසු වන හෙයිනි.

මනෝ විද්‍යාව තුළ ප්‍රාණ සංකල්පය සාකච්ඡාවට ලක් විය යුත්තකි. ප්‍රාණ යන්න බ්‍රහ්මන්, හිරණ්‍යගර්භ, ශාරීරික ක්‍රියාකාරීත්වය හා ආශ්වාස කිරීම යන අර්ථ සඳහා මෙහිදී භාවිත වෙයි. ලොව ඇති සියල්ල ප්‍රාණය ඇතිවිට එයින්ම නිර්ගත වේ. එසේම ප්‍රාණය සියලු දෙවියන්ගේ ආත්මයද වෙයි. ප්‍රාණය ඉහළට හා පහළට හෙලන්නේ ඔහුමය යන ඉගැන්වීමෙන් ප්‍රාණයේ ක්‍රියාකාරීත්වය රැඳී පවතින්නේද බ්‍රහ්මන් තුළ බව පෙන්වා දෙයි. සත්ත්වයා ජීවත්වන්නේ ප්‍රාණයෙන් නොවෙයි. අන් දෙයකිනි. එය නම් බ්‍රහ්මන්ය. මිනිසාගේ ක්‍රියාකාරීත්වය මෙහෙයවීම පිළිබඳ කිසිදු නිදහසක් ඔහුට හිමි නොවේ. ප්‍රාණයෙන් මනසින් සිදුවනුයේ ශාරීරික ක්‍රියාකාරීත්වයත් ඉන්ද්‍රිය ක්‍රියාකාරීත්වයත් ඇති කිරීමයි.

මේ අනුව පෙනීයන්නේ කඨෝපනිෂදය හරහා අංග සම්පූර්ණ මනෝවිද්‍යාවක් ඉදිරිපත් නොවුණද නූතනයේදී මනෝවිද්‍යාව යටතේ සාකච්ජා වන බොහෝ අංගයන් පිළිබඳව කඨෝපනිෂදයෙන් අවධානය යොමු කර ඇති බව ඉහත සඳහන් කරුණුවලින් ගම්‍ය වන බවයි.

## ආචාර විද්‍යාව (Ethics)

ආචාර ධර්ම පද්ධතියක අවසන් ප්‍රතිඵලය වන්නේ විමුක්තිය ළඟා කර ගැනීමය. ඉන් පරිබාහිරව ආත්ම ඥාන දර්ශනයක් නොවේ. එමනිසා සෑම දර්ශනයක් තුළම ආචාරධර්ම පිළිබඳ කරුණු දක්වා ඇත. විමුක්තිය යනු ඥානයේ උසස්තම අවස්ථාව වේ. සදාචාර සම්පන්න ප්‍රතිපත්ති මාලාවක් හරහා

පුද්ගලයාට ආධ්‍යාත්මික මෙන්ම බාහිර වූද පාරිශුද්ධිය ලද හැකිය.

උපනිෂද් දර්ශනය මූලික වශයෙන් ගොඩනැගී ඇත්තේ ආචාරධර්ම 5ක් යටතේය. ඒවා නම් තපස් රැකීම, දානය, ඍජු ක්‍රියාමාර්ග, අහිංසාව හා සත්‍ය වචනයයි. බ්‍රහ්මචාරී, ගෘහස්ථ, වානප්‍රස්ථ හා සන්‍යාසී යන ආශ්‍රම ධර්ම මගින් ක්‍රමිකව මෙම ආචාර ධර්මයන්හි ඥානාර්ථියා හික්මවනු ලබයි.

බ්‍රහ්මචාරී අවදියේදී සිය ජීවිතය අධ්‍යනය සඳහා කැප කළ යුතු වෙයි. විරාගය එහිදී අත්‍යවශ්‍යය. බ්‍රහ්ම විද්‍යාව ලද හැක්කේ ශ්‍රවණ, මනස සහ නිදිධ්‍යාසන යන ආකාර තුන තුළිනි. ශ්‍රවණ යනු ගුරු වචනය ශ්‍රද්ධාවෙන් ඇසීමයි. මනන යනු අසන ලද දෙය මැනවින් මෙනෙහි කිරීමය. නිදිධ්‍යාසන යනු භාවනානුයෝගීව මනනය කළ දේ තවදුරටත් මෙනෙහි කිරීමය. මෙම කාලය තුළ ගුරුවරයා වෙනුවෙන් භික්ෂාටනයෙහි යෙදිය යුතු අතර සත්‍ය ප්‍රකාශ කිරීම, යුක්තිය ඉටු කිරීම ආදි සදාචාරවත් ක්‍රියා අනුගමනය කළ යුතුද වේ.

ඉගෙනීමෙන් පසු නැවත නිවසටම පැමිණෙන ශිෂ්‍යයා ඉන්පසු විවාහයට එළඹිය යුතුය. යාගහෝමාදියේදී හැර අනෙකුත් අවස්ථාවලදී පරපණ නැසීමෙන් වෙන්වීම. ධාර්මික දිවි පෙවතක් ගත කිරීම, අඛණ්ඩව වේද අධ්‍යනය කිරීම, ගෘහස්ථ කාලයේදී කළ යුතුය. වානප්‍රස්ථ අවස්ථාවලදී තමා සතු වස්තුව භාර්යාවට පවරා විරාගී බවට යොමු වීම සිදු කළ යුතුය. සියල්ල අතහැර බ්‍රහ්මාවබෝධය සඳහා යොමු වීම සන්‍යාසී අවධියේදී සිදු කළ යුතු අතර දුෂ්කර වූ සදාචාරාත්මක ජීවිතයක් ගත කළ යුතුය. මේ අනුව කඨෝපනිෂදයෙහි ආචාරධර්ම පිළිබඳ අදහස් දක්වා ඇත්තේ දානය උතුම් සත් චාරිත්‍රයක් වන බවයි. විශ්වජිත් යාගය තමා සතු සියල්ලම පූජා කරන්නක් වේ. අවසන් වරට තණ කැකිරි දෙවූ මහලු දෙනුන් පූජා කරන්නා ප්‍රීතියෙන් තොර ලොවකට යයි යනුවෙන් දැක්වෙන ප්‍රකාශයට අනුව දෙන දේ හොඳම දේ විය යුතු බවත් කර්මය ප්‍රතිඵලයට බලපාන බවත් පෙන්වා දෙයි. සත්‍ය වචනය, පොරොන්දු කඩ නොකිරීම ආචාර ධර්මයන් ලෙස පිළිගත් බව වාජශ්‍රවස් සිය පුතු පවා පූජා කර තිබීමෙන් මනාව සනාථ කෙරේ. තවද ආගන්තුක සත්කාරය පිරිහෙලූ කවරකු වුවද දඬුවමකට ලක් විය යුතු තත්ත්වයකට පත් කොට ඇත.

පස්කම් සුවයෙන් වෙන්වීම විරාගයයි. එය බ්‍රහ්මාවබෝධය සඳහා අත්‍යවශ්‍ය වුවකි. නචිකේතස් යම විසින් තමාට දීමට පොරොන්දු වූ ශතවර්ෂායුෂ්ක දූ පුතුන් ගව මහීෂ රන් රුවන් ආදි සියලු වස්තූන් ප්‍රතික්ෂේප කරන ලද්දේ ආශා ප්‍රහීණ කළ යුතු බැවිනි. ආත්ම විද්‍යාව ලබා ගැනීමට සුදුසුකම් 4ක් අවශ්‍ය වේ. එනම්,

1) නිත්‍යානිත්‍ය වස්තු විවේචකය - සදාකාලික වූ සහ නොවූ විෂයන් පිළිබඳ විවේක බුද්ධිය
2) ඉහාමුත්‍රඅර්ථඵල භෝග විරාමය
3) ශමදමාදි ෂට්ක සම්පත්තිය - ශමය, ඉන්ද්‍රිය දමනය ආදි ආචාර ගුණ ෂට්කය ඇති කර ගැනීම
4) මුමුක්ෂුත්වය - සසර දුකෙන් මිදෙනු කැමැත්ත

මේවායින් යුක්ත වුවකුට මිස වෙන්වුවකුට ආත්මඥානය පිළිබඳ අපේක්ෂා කළ නොහැකිය (සුමනවංස හිමි, 2002).

කර්ම සිද්ධාන්තය සදාචාරාත්මක ජීවිතයක් සඳහා යොමු වීමට බොහෝ සේ අවශ්‍ය වෙයි. තත්ත්ව ඥානය ලබන තුරු අඛණ්ඩ සසර ගමනක යෙදීමට සිදු වන බව පිතෘ ලෝක, යම ලෝක, ගාන්ධර්ව ලෝක, බ්‍රහ්ම ලෝක පිළිබඳ විශ්වාසයන්ගෙන් තහවුරු වේ. ජීවිතය අස්ථිර වුවකි. ඒ නිසා ස්ථිර වූ විමුක්තිය ලබා ගැනීමට ඉන්ද්‍රිය දමනයත් චිත්ත සංයමයත් අවශ්‍යතම අංග විය. සූක්ෂ්ම ඉන්ද්‍රියයන් වඩාත් සූක්ෂ්ම වූ ඉන්ද්‍රියයන් තුළ සංයමය කිරීම බලවත් ආත්ම පරිශ්‍රමයකින් කළ යුත්තක් වෙයි.

කඨෝපනිෂදයෙහි අන්තර්ගත ආචාර ධර්ම අවශ්‍ය වන්නේ ආත්මාවබෝධය ලබන තෙක් පමණි. නැතහොත් "ජීවන් මුක්ත" තත්ත්වයකට පත්වන තෙක්ය. ජීවන් මුක්තයා මරණින් පසු ක්‍රම මුක්තයකු වන හෙයින් ඉන්පසු ආචාර ධර්ම අවශ්‍යතාවක් පැන නොගනියි. එසේම එවැන්නකුගෙන් ආචාර ධර්ම විරෝධී කිසිවක්ද සිදු විය නොහැකිය.

අවිද්‍යාවෙන් ඈත් වී විද්‍යාවෙන් යුක්ත වීමට සියල්ල තමා තුළත් තමා සියල්ල තුළත් ඇති බව තේරුම් ගැනීමට මනස දියුණු කළ යුතුය. ඉන්ද්‍රියයන්ට විෂය නොවූ අතීන්ද්‍රිය තත්ත්වයන් වටහා ගැනීමට ආචාර ධර්ම සමූහයක අවශ්‍යතාව කඨෝපනිෂදයෙහි පෙන්වාදී ඇත.

## 4. නිගමන සහ නිර්දේශ

පෙරදිග දර්ශනය තුළ වෛදික සාහිත්‍ය කෘතීන්හි වැදගත්ම කෘතීන් සමූහය ලෙස උපනිෂද් කෘති අතර හැඳින්වීම සාධාරණය. මන්දයත්, ආරණ්‍යකවලින් ආරම්භ වූ ඇතැම් මූල බීජ අවස්ථාවන් මුහුකුරා යමින් දර්ශනවාද රාශියකටත් එයින් භාරතීය චින්තනයෙහි අතිදැවැන්ත චින්තන පෙරළියකටත් මූලික වූ අදහස් ගැබ්ව පැවති කෘති පෙළක් වන බැවිනි. උපනිෂද් සාහිත්‍යය අතුරින් මුඛ්‍යෝපනිෂද් ලෙස විශේෂ අවධානයට භාජනය වන උපනිෂද් 12ක් පවතින අතර එම ග්‍රන්ථ අතුරින් කඨෝපනිෂදය සාහිත්‍යමය වශයෙන් පමණක් නොව දාර්ශනික වශයෙන්ද සුවිශේෂ වූ අගයකින් යුත් උපනිෂද් කෘතියක් වෙයි.

කඨෝපනිෂදයෙහි අන්තර්ගත ඉගැන්වීම්වල දාර්ශනික වැදගත්කමකින් යුත් කරුණු රාශියක් පවත්නා බව ඉහත සාකච්ඡාවේදී පෙනී යන කරුණකි. එහිදී ප්‍රධාන මාතෘකා පහක් යටතේ එහි අන්තර්ගත දාර්ශනික වැදගත්කම අවධානයට ලක් කළ හැකිය. එනම්, පාරභෞතික විද්‍යාව, ලෝක විභාගය, ඥාන විභාගය, මනෝ විද්‍යාව සහ ආචාර ධර්ම යන්නයි. මෙම එක් එක් තේමාවන් යටතේ අතිශය වැදගත් වන්නා වූ දාර්ශනික වැදගත්කමකින් යුත් අදහස් ඉදිරිපත් වී තිබෙන බව පෙනෙයි.

පාරභෞතික විද්‍යාව යටතේ ඉන්ද්‍රිය විෂය ඉක්මවා යන්නා වූ පරමාර්ථ සත්‍යය ස්වරූපය පිළිබඳ අවධානය යොමු කර තිබේ. ඒ අනුව කඨෝපනිෂදය තුළ එන පරමාර්ථ සත්තාව වනාහී බ්‍රහ්මන් නොහොත් ආත්මන් වෙයි. තවද පාරභෞතික විද්‍යාව යටතේ කඨෝපනිෂදය සසරෙහි ස්වරූපය කවරේද?, ආත්ම විශ්වාසය අනුක්‍රමයෙන් අසහාය පදාර්ථයක් බවට පත් වීමත් සමගම මිනිසා මළ පසු ආත්මයට සිදුවන්නේ කුමක්ද?, ආත්මය මිනිසා මළද ඒ ඒ තැනට ගොස් නැවත නැවතත් උපතක් ලබා දෙන්නේ නම් එසේ නැවත නොඉපදීම සඳහා ආත්මය කළ යුත්තේ කුමක්ද යනාදියට සාර්ථකව පිළිතුරු සපයා ඇති බව පෙනේ. මේ අනුව කඨෝපනිෂදය තුළ පාරභෞතික විද්‍යාවකට අවශ්‍ය වන මූලික කරුණු සියල්ලක්ම පාහේ අන්තර්ගතව පවතින බව දැක්විය හැකිය.

තවද කඨෝපනිෂදය තුළ ලෝක විභාගයට අවශ්‍ය මූලික අඩිතාලම වැටී ඇති සංසාරය පදනම් කරගෙන අදහස් දක්වා තිබීමද එහි දාර්ශනික වැදගත්කම මනාව ප්‍රකට කරන්නකි. විශේෂයෙන්ම මරණින් මිනිසාගේ අවසානය සිදු නොවන බවත් ඊට හේතුන් දක්වා තිබීමත් වැදගත් වෙයි. තවද බ්‍රහ්මන් වනාහී ලෝකාධිපතිය යන්නත්, විෂය ලෝකය ක්‍රියාත්මක වන්නේ බ්‍රහ්මාධිපත්‍යය යටතේ බවත් දක්වා ඇත. එමෙන්ම විවිධ වූ ලෝක පිළිබඳවද කඨෝපනිෂදයෙහි එන ලෝක විභාගය තුළ අවධානයට ලක් වූවකි.

එමෙන්ම ඥාන විභාගය හා සම්බන්ධවද වැදගත් දාර්ශනික කරුණු රාශියක් ඉදිරිපත් වීමද වැදගත් වෙයි. එහිදී මිනිසාට ඥානය ලැබෙන්නේ කවරාකාරයෙන්ද යන්න පැහැදිලි කර ගැනීම සඳහා ඥාන ගවේෂණ මාර්ගයක් ලෙස කඨෝපනිෂදය තුළ පරමාර්ථ බ්‍රහ්මඥානය හෙවත් ආත්ම දර්ශනය දැක්විය හැකිය. මීට අමතරව ව්‍යාඛ්‍යානය හෙවත් කරුණු පැහැදිලිව ප්‍රකාශ කිරීමත්, අපෝහ ක්‍රමයත් (Dialectic Method) දත් දෙයින් නොදත් දෙය කරා යාම හෙවත් උද්ගාමී ක්‍රමයත්, ප්‍රත්‍යක්ෂය, අනුමානය, උපමානය සහ ශාබ්ද හෙවත් ආප්ත වචනය යන ක්‍රම චතුෂ්කයමද ඥාන මාර්ග ලෙස මෙහිදී භාවිත කර තිබීම වැදගත්ය. මීට අමතරව තර්කණය ඥාන විෂයෙහිලා උසස් තැනක් හිමි කර නොගනී. මන්ද තර්කණය තුළින් බ්‍රහ්ම ඥානය වටහා ගත හැක්කක් නොවන හෙයිනි.

මනෝ විද්‍යාව සම්බන්ධයෙන්ද කඨෝපනිෂදයෙහි වැදගත් ස්ථානයක් ලැබෙයි. මන්ද කඨෝපනිෂදයේ දී මනසේ ප්‍රධානත්වය පිළිබඳ අවධාරණය කෙරෙයි. ඒ සඳහා රථෝපමාවක් ඔස්සේ කරුණු ඉදිරිපත් කිරීම ඉතා සිත් ගන්නා සුලුය. තවද ප්‍රාණය නැමැති සංකල්පය පිළිබඳ කඨෝපනිෂදය තුළ කරුණු අන්තර්ගතවීම වැදගත් වේ. විශේෂයෙන්ම පංචේන්ද්‍රියයන් මනසත් සමග නිශ්චල කර ගැනීමෙන්ම ඉහලම තත්ත්වයට ලඟා විය හැකි බව දැක්වීමද වැදගත් වේ. මේ අනුව අංගසම්පූර්ණ මනෝවිද්‍යාවක් කඨෝපනිෂදයෙන් අපට බලාපොරොත්තු විය නොහැකි වුවත් නූතනයේ සම්භාවිතව ඇති බොහෝ අංගයන් පිළිබඳව ආදි යුගයේ මිනිසුන් සිය අවධානය යොමු කර ඇති බව වටහා ගැනීමට මෙය ඉවහල් වෙයි.

ආචාර විද්‍යාව සම්බන්ධයෙන්ද කඨෝපනිෂදය තොරතුරු ගෙනහැර දක්වයි. එහිදී දානය උතුම් සත් චාරිත්‍රයක් බව දක්වා ඇත. පුද්ගලයකුට විමුක්තිය ආචාරධර්ම පද්ධතියක අවසන් ප්‍රතිඵලය ලබා ගැනීමට නම් සදාචාර මාර්ගයේ යා යුතු බව දක්වමින් ත්‍රිවිධාකාරයේ වූ සදාචාර දර්ශනයක් ඉදිරිපත් කරයි. ඒවා නම් දම, දාන,දයා වෙයි. මෙම සදාචාරාත්මක අංශයන්ට අනුව ක්‍රියාත්මක කිරීමෙන් මෝක්ෂය ලඟා කර ගත හැකි බව දැක්වීමෙන් පැහැදිලි වන්නේ සදාචාරය ප්‍රගුණ කිරීම මෝක්ෂ මාර්ගයෙහි අංගයක් ලෙස සලකා ඇති බවයි. විශේෂයෙන්ම ඉන්ද්‍රියයන්ට ගෝචර නොවූ අතීන්ද්‍රිය තත්ත්වයන් වටහා ගැනීමට ආචාර ධර්ම සමූහයක අවශ්‍යතාව මෙහිදී පෙන්වා දී ඇත.

මීට අමතරව ඉහත කරුණු අධ්‍යයනයේදී පෙනීයන්නේ කඨෝපනිෂදය හදාරන්නකුට එහි අන්තර්ගත ඉගැන්වීම්වල අදහස් අතින් පමණක් නොව, ප්‍රකාශන ක්‍රමයෙන්ද, පාරිභාෂික වචනවලින්ද බුදු දහමට සමාන කියමන් රාශියක් ලැබෙන බවයි. මේ අනුව අවසාන වශයෙන් නිගමනය කළ හැකි කරුණක් වනුයේ දාර්ශනික වශයෙන් කඨෝපනිෂදය යම් ආකාරයක නිශ්චිත වූ පාරභෞතික විද්‍යාවක්, ලෝක විභාගවාදයක්, ඥාන විභාගවාදයක්, මනෝ විද්‍යාවක් මෙන්ම ආචාර විද්‍යාවක් ඇතුළත් අතිශය වැදගත් සාහිත්‍ය නිර්මාණයක් වන බවයි.

**ස්තුතිය:** මෙම ශාස්ත්‍රීය ප්‍රයත්නය ඉදිරිපත් කිරීමේදී බොහෝ දෙනකුගෙන් මට ලැබුණු සහයෝගයට කෘතඥතාව සහ ස්තුතිය ප්‍රකාශ කිරීමට මම අවංකවම කැමැත්තෙමි. මගේ අධීක්ෂක ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සුමේධ වීරවර්ධන මැතිතුමාගේ අපරිමිත සහාය සහ දිරිගැන්වීම් සඳහා මම පළමුවෙන්ම මගේ කෘතඥතාව පුද කරමි. මීට අමතරව මගේ ආදරණීය සොහොයුරිය වන වෛද්‍ය කුමුදු වෙත්තසිංහ මහත්මියගේ ආදරය සහ කාරුණික සහයෝගයට මාගේ ප්‍රණාමය සහ ආදරය පිරිනැමේ.

## 5. ආශ්‍රිත ග්‍රන්ථ

ඉන්ද්‍රජෝති හිමි, බී. (2013). *උපනිෂද් සාහිත්‍යය හැඳින්වීම.* ඤාණරතන, වැලමිටියාවේ, ඉන්ද්‍රජෝති හිමි, බලදෙර., ධම්මවිමල, උඩගලදෙණියේ, සහ ලියනගේ, බ්‍රර්ට්‍රන් ජී. (සංස්.), *උපනිෂද් අධ්‍යයන (පි. 4-10).* විද්‍යාලංකාර ශාස්ත්‍රීය සංග්‍රහය, පැලියගොඩ: පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙණ.

කළුපහන, ජී. (1963). *භාරතීය දර්ශන ඉතිහාසය.* කොළඹ: රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව.

කැකුළාවල, එස්. එල්. (1961). *කඨෝපනිෂදය.* කොළඹ: සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

ඤාණිස්සර හිමි, ඒ. (1988). *භාරත දර්ශන.* කොළඹ 10: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

ධම්මරතන හිමි, එන් සහ පඤ්ඤාලෝක හිමි, එච්. (1950). *භාරතීය දර්ශන.* කොළඹ: සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

මොරටුවගම, එච්. එම්. (1999). *උපනිෂද් ආචාර ධර්ම.* මේධානන්ද හිමි, ඉඹුලපිටියේ සහ උපනන්ද හිමි, මැස්ටියේ. (සංස්.), *මාගධී (එකළොස් වන කලාපය).* නුගෝගොඩ: පාලි හා බෞද්ධ අධ්‍යයන සංසදය.

ශාන්තසිරි හිමි, එස්. (2011). බෘහදාරණ්‍යක උපනිෂදයෙහි විද්‍යාමාන දාර්ශනික සංකල්ප කිහිපයක් පිළිබඳ විමසුමක්. *දර්ශන අධ්‍යයන.* දර්ශනපති හෝමාගම ධම්මානන්ද නාහිමි අභිනන්දන ශාස්ත්‍රීය කලාපය.

සුමනවංස හිමි, එන්. (2002). කඨෝපනිෂදයේ එන දාර්ශනික අදහස්. රේවත හිමි, නවගමුවේ සහ ගල්මංගොඩ, සුමනපාල. (සංස්.), *සම්භාවනා (පි. 89-115).* අතිපූජ්‍ය මාගල බුද්ධානන්දාභිධාන මහාධිකරණ නාහිමි අභිස්තව ශාස්ත්‍රීය සංග්‍රහය.

සුමනවංස හිමි, එන්. (2013). කඨෝපනිෂද්, ප්‍රශ්නෝපනිෂද් හා ශ්වේතාශ්වර උපනිෂද්. ඤාණරතන, වැලමිටියාවේ, ඉන්ද්‍රජෝති හිමි, බලදෙර., ධම්මවිමල, උඩගලදෙණියේ, සහ ලියනගේ, බ්‍රර්ට්‍රම් ජී. (සංස්.) *උපනිෂද් අධ්‍යයන (පි. 108-111).* විද්‍යාලංකාර ශාස්ත්‍රීය සංග්‍රහය, පැලියගොඩ: පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙණ.

සෙනෙවිරත්න, ඒ. (2007). *උපනිෂද් - වේදාන්ත දර්ශනය.* නුගේගොඩ: සුරවි ප්‍රකාශන.

සෙනෙවිරත්න, සී. ඒ. ඩී. (1961). *උපනිෂද්.* කොළඹ: සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

Madhavananda, S. (1950). *The Brhadaranyaka Upaniṣad.* Himalayas: Advaita Aṣrama.